රාජ්‍ය දැව සංස්ථාව

පාරිභෝගික විශ්වාසය දිනාගත් දැව කර්මාන්තයේ සැබෑ නායකත්වය

2020

වාර්ෂික වාර්තාව



වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය



රාජ්‍ය දැව සංස්ථාව

වාර්ෂික වාර්තාව 2020

දැව වෙළෙඳපොලෙහි සැබෑ නායකත්වය උදෙසා

1968 - 2020

52 වසරක නොනිමි ගමන් මග
රාජ්‍ය දැව සංස්ථාව

ජන හද දිනූ
ආයතනයක්
ලෙස පෙරටම

දැක්ම

ජාතියේ විශ්වාසනීයත්වය දිනූ
අනර්ඝතම දැව හා දැවමය
භාණ්ඩ සැපයුම්කරුවීම සහ දැව
වෙළඳපොළෙහි සැබෑ නායකත්වය
ඉසිලීම

මෙහෙවර

අප සතු තාක්ෂණික දැනුම,
කීර්තිනාමය හා නිපුනතාවය
උපයෝගී කරගනිමින්
නීත්‍යානුකූලව, පරිසර හිතකාමී
අන්දමින් ජාතික අවශ්‍යතාවය
අනුව අපගේ ගැනුම්කරුවන්ගේ
දැව සහ දැවමය භාණ්ඩ ඉල්ලීම
නිෂ්පාදනය කර ලබාදීම















අනර්ඝතම දැවමය නිෂ්පාදන

අපේ කථාව

රාජ්‍ය දැව සංස්ථාව රජය සතු ව්‍යාපාරයකි. එය 1968.04.04 දිනැති හා අංක:14796 දරණ ගැසට් පත්‍රය මඟින් ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ගරු අමාත්‍යතුමන් විසින් 1957 අංක 49 දරණ රජයේ කාර්මික සංස්ථා පනතේ බලතල ප්‍රකාරව පිහිටුවන ලද අතර, 1969 නොවැම්බර් 07 දිනැති අංක 14879 දරණ ගැසට් පත්‍රය, 1982 පෙබරවාරි 05 දිනැති අංක:178/10 අති විශේෂ ගැසට් නිවේදනය, 2001 වර්ෂයේ ජුනි 26 දිනැති අංක:1190/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රය සහ 2008 පෙබරවාරි 25 දිනැති අංක:1538/7 දරන ගැසට් පත්‍ර අනුව තවදුරටත් සංශෝධනය කොට යාවත්කාලීන කරන ලදී. යෙදවූ මූලික ප්‍රාග්ධනය රු.මිලියන 2.5 කි. වර්ෂ 52කට වැඩි අත්දැකීම් හා පළපුරුද්ද ඇති ආයතනයක් ලෙස රාජ්‍ය දැව සංස්ථාව ඉහළ ප්‍රමිතියෙන් යුතු ගෘහ භාණ්ඩ අවශ්‍යතා ඇති හෝටල් හිමිකරුවන්ගේ, රජයේ ආයතනවල සහ ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ඇතුළු පෞද්ගලික ගැනුම්කරුවන්ගේ ප්‍රමුඛ තේරීමක් බවට පත්ව ඇත.

රාජ්‍ය දැව සංස්ථාව ඉහළ ගුණාත්මක බවින් යුතු අනර්ඝතම දැවමය නිෂ්පාදන පාරිභෝගිකයින් හට සැපයීමට හා උපරිම සේවාවක් ලබාදීමට හැකි සෑම අවස්ථාවකදීම උත්සාහ දරයි. අලංකාර නිවාස, සුඛෝපභෝගී හෝටල්, විධායක කාර්යාල ඇතුළු විදේශීය වාසස්ථාන සඳහා ද, අපගේ අනර්ඝ දැව ඉහළ වටිනාකමක් එක් කරයි. මනා ලෙස කළමනාකරණය කරන ලද වනවගා මඟින් ලබාගනු ලබන වටිනා දැව මඟින් කරනු ලබන සුවිශේෂී නිෂ්පාදන වන කාර්යාල හා නිවාස සඳහා වූ ගෘහ භාණ්ඩ, කඳුන් හා ඉරෑ දැව අපගේ පාරිභෝගිකයන් උපරිම තෘප්තිමත්භාවයට පත්කිරීමට සමත් වේ. කීර්තිමත් රාජ්‍ය ආයතනයක් ලෙස රාජ්‍ය දැව සංස්ථාව පුළුල් පරාසයක පැතිරුණ ඉහළ පෙළේ හා දීර්ඝ කල්පැවැත්මක් ඇති දැවමය නිෂ්පාදන වෙළෙඳපොළට ඉදිරිපත් කරනු ලබන අතර, නිෂ්පාදන නවීන තාක්ෂණයෙන් යුතු අධි තාක්ෂණික යන්ත්‍රෝපකරණවලින් සමන්විත නවීන වැඩ පරිසරයක් තුළ නිපදවනු ලබයි.

සිත් ඇදගන්නා අසුන්වල සිට සුවිශේෂී නිදන කාමර කට්ටලයන් දක්වා පාරිභෝගිකයන් විසින් ඉල්ලුම් කරනු ලබන මිළට හා කාල වකවානුව තුළ ඉහළ ගුණාත්මකභාවයෙන් යුතුව, නිෂ්පාදන ලබාදීමේ හැකියාව රාජ්‍ය දැව සංස්ථාව සතුව පවතී. අපගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය අප විසින් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා උපයෝගී කරගන්නා පහත දක්වා ඇති ක්‍රියාමාර්ග තුළින් සනාථ කරනු ලබයි.

- තිරසාරව කළමනාකරණය කරන ලද වනවගා මඟින් ලබාගනු ලබන පරිණත දැව අපගේ නිෂ්පාදනයන් සඳහා යොදාගනු ලැබීම.
- ඵලය හා දෝෂ රහිත, ඉහළ ශ්‍රේණියේ දැව භාවිතා කරනු ලැබීම.
- මනා ලෙස පරිරක්ෂණය කරන ලද දැව භාවිතය.
- නවීන නිෂ්පාදන ක්‍රියාවලි සඳහා යන්ත්‍රෝපකරණ භාවිතය.
- ගුණාත්මකභාවය සහ සහතික කරන ලද අනෙකුත් දැව නොවන අමුද්‍රව්‍ය භාවිතය.
- එකලස් කිරීමේ හා නිම කිරීමේ නවීන ශිල්පක්‍රම භාවිතය.

නිෂ්පාදනවල ගුණාත්මකභාවය හැරුණුවිට, සංස්ථාව මඟින් සපුරාලනු ලබන සියලුම ආකාරයේ ගෘහ භාණ්ඩ අවශ්‍යතා සඳහා නොමිලේ ඇස්තමේන්තු



රාජ්‍ය දැව සංස්ථාවේ ස්වරූපය

වත්කම්
රු. මිලියන 7,286

සේවකයන්
1,708

අලෙවි ආදායම
රු. මිලියන 3,982

වගකීම්
රු. මිලියන 1,822

කිරීමේ සේවාවක් සහ මිනුම් සේවාවක් සපයනු ලබයි. තවද, ඉහළ ප්‍රතිලාභ සහිත අපගේම පිරිවිතරයන්ට අනුව නිෂ්පාදනය කරන ලද උසස් තත්ත්වයේ ගෘහ භාණ්ඩ පරාසයක් වෙළෙඳපොළට සැපයීමට අපි සහතික වෙමු. අපගේ නිෂ්පාදන පරාසයන් පුළුල් කිරීමට අමතරව විශේෂයෙන් අපගේ සේවාවන් සහ ගනුදෙනුකරුවන් සඳහා සේවා පරිසරය ද අපි නිරන්තරයෙන් වැඩිදියුණු කිරීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට ද සහතික වෙමු.

අපගේ කාර්යයන්

මූල්‍ය වශයෙන් ස්ථායී වේ

නිවාස හා සේවා ස්ථාන ඉදිකිරීම සඳහා තිරසාර අමුද්‍රව්‍ය සපයනු ලැබේ

තිරසාර වන කළමනාකරණ ක්‍රමෝපායන් යොදාගනිමින් පරිසරය ආරක්ෂා කිරීමටත් වර්ධනය කිරීමටත් දායක වේ.

ආදායම් බදු හා භාණ්ඩාගාර බදු ගෙවමින් ප්‍රජා සංවර්ධනය සඳහා දායක වේ

පුළුල් පරාසයක පැතිරුණ නවීන හා සම්ප්‍රදායික ගෘහ භාණ්ඩ සපයනු ලැබේ

පටුන

මූල්‍ය ප්‍රකාශන උද්ධෘත	08-09
ආයතනික තොරතුරු	10
කළමනාකරණ මඬුල්ල	11-13
සභාපතිතුමාගේ සමාලෝචනය	16-18
සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය	20-23
අපගේ කාර්යභාරයන් හා අපගේ ව්‍යාපාරික වටිනාකම්	24-25
අධ්‍යක්ෂක මණ්ඩලය	26
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මඬුල්ල	27
අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය	30-33
අපගේ ආවරණ කලාප	34
විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව	35-36
ව්‍යාපාරික සාරාංශය	37-38
දශකයක තොරතුරු	39
අවදානම් කළමනාකරණය	42-46
ආයතනික සමාජ වගකීම	48-52
විගණකාධිපතිගේ වාර්තාව	56-65
වාර්ෂික ගිණුම්	68-90
මූල්‍ය පාරිභාෂික ශබ්ද මාලාව	96-97



මූල්‍ය ප්‍රකාශන උද්ධෘත

දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා		2020	2019	වෙනස %
ඉපැයීම් සම්බන්ධ ප්‍රධාන දත්ත සහ අනුපාත				
අයභාරය	රු. '000	3,981,688	4,282,181	-7%
භාණ්ඩාගාර හා ආදායම් බදුවලට පෙර ලාභය	රු. '000	569,521	512,947	11%
භාණ්ඩාගාරයට ගෙවූ බදු	රු. '000	511,026	50,000	922%
ආදායම් බදු	රු. '000	105,615	195,524	-46%
වර්ෂය සඳහා විස්තීරණ ආදායම්	රු. '000	463,907	317,424	46%
ස්කන්ධය මත ඉපැයීම්	%	8.0	5.7	40%
වත්කම් මත ඉපැයීම්	%	6.0	4.4	37%
ශේෂපත්‍ර සම්බන්ධ ප්‍රධාන දත්ත සහ අනුපාත				
මුළු වත්කම්	රු. '000	7,286,194	7,222,054	1%
මුළු ස්කන්ධය	රු. '000	5,464,633	5,540,551	-1%
මුළු ණයහිමියෝ	රු. '000	1,821,561	1,681,503	8%
ණය/ස්කන්ධය (භාණ්ඩාගාර බදු පෙර හා ආදායම් බදු පසු)	%	33.3	30.3	10%
ණය/මුළු වත්කම් (භාණ්ඩාගාර බදු පෙර හා ආදායම් බදු පසු)	%	25.0	23.3	7%
වෙනත් තොරතුරු				
මුළු සේවකයන්	සංඛ්‍යාව	1,708	1,803	-5%
එක් සේවකයෙකුට අයභාරය	රු. '000	2,331	2,375	-2%
එක් සේවකයෙකුට ලාභය	රු. '000	333	284	17%









ආයතනික තොරතුරු 2020

ගරු සී.බී.රත්නායක මහතා - වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා

බන්දුල හරිස්චන්ද්‍ර මහතා - ලේකම්, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යංශය

අධ්‍යක්ෂ මණ්ඩලය - 2020

උදය සී. වලිසිංහ මහතා - සභාපති - රාජ්‍ය දැව සංස්ථාව
බී.එන්.ගමගේ මහත්මිය - අධ්‍යක්ෂ (භාණ්ඩාගාර නියෝජිත)
ඩබ්ලිව්.ඒ.සී.වේරගොඩ මහතා - අධ්‍යක්ෂ (වන සංරක්ෂණ ජනරාල්)
පී.කේ.ප්‍රසන්න මහතා - අධ්‍යක්ෂ
පී.ඩී.ප්‍රීති ගුණතිලක මහතා - අධ්‍යක්ෂ
එච්.කේ.එම්.ජේ.එච් කුමාරසිංහ මහතා - අධ්‍යක්ෂ
බී.ඒ.ධර්මරත්න මහතා - අධ්‍යක්ෂ

එම්.ජී.දිලානි ශාරිකා මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

විගණන හා කළමනාකරණ කමිටුව

බී.එන්.ගමගේ මහත්මිය - කමිටු සභාපතිනි
එච්.කේ.එම්.ජේ. කුමාරසිංහ මහතා - කමිටු සාමාජික
පී.කේ.ප්‍රසන්න මහතා - කමිටු සාමාජික

විගණක

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.

ප්‍රධාන බැංකුව

ලංකා බැංකුව

මුදල් වර්ෂය

ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 වන දින දක්වා

දුරකථන : +94112866600-5
ෆැක්ස් : +94112866623
වෙබ් අඩවිය : www.timco.lk



කළමනාකරණ මඩුල්ල 2020

සාමාන්‍යාධිකාරි	ආචාර්ය එන්.ඩී.රුවන්පතිරණ	PhD (Forestry), M.Sc. (Forestry), B.Sc.
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්		
නි.සාමාන්‍යාධිකාරි (මුදල්)	ජී.ඩී.එස්.කුමාරසිංහ මයා	MBA, B.Sc. (Fin.Mgr), ACA, ACMA
නි.සාමාන්‍යාධිකාරි(මානව සම්පත් හා පාලන)	එම්.ඒ.සී.එන්.සමරසිංහ මයා	MPM, B.Sc (Business studies) Ad.Dip in Mgt. and Admin.
නි.සාමාන්‍යාධිකාරි (මෙහෙයුම්)	එම්.සී.දේවේන්ද්‍ර මයා	M.Sc. (Forestry), B.Sc.
නි.සාමාන්‍යාධිකාරි (අලෙවි)	ඩබ්.බී.සමන්ත මයා	M.Sc. (Forestry), B.Sc. N. Dip. Teaching
නි.සාමාන්‍යාධිකාරි (ඉංජිනේරු හා නිෂ්පාදන) (වැ/ආ)	ජී.ජී.තිසර ගමගේ මයා	B.Sc.
සහකාර සාමාන්‍යාධිකාරි (කලාප)	පී.කේ.අජිත් චන්දන මයා	B.Sc. (Hons.)
සහකාර සාමාන්‍යාධිකාරි (කලාප)	එච්.බී.රජවත්ත මයා	BA
සහකාර සාමාන්‍යාධිකාරි (පර්යේෂණ, සංවර්ධන හා ප්‍රහුණු)	සි.කේ.මුතුමාල මයා	M.Sc. (Forestry), B.Sc. (Agri.) (Hons.)
කළමනාකරුවන්		
කළමනාකාර (පාලන)	ඒ.ජී.එච්.කුලරත්න	M.LRHRM, PgD. LRHRM, PQHRM, Dip.in Mgt, Dip. in Forestry, Dip.in English, AMCIPM, ACPM.
කළමනාකාර (මුදල්)	පී.ටී.එන්.බෝවත්ත මිය	
කළමනාකාර (මුදල්)	එච්.ජී.ආර්.විජේනායක මයා	
කළමනාකාර (අභ්‍යන්තර විගණන)	එච්.එම්.එස්.මාධව මයා	B. Com.sp
කළමනාකාර (යාන්ත්‍රික ඉංජිනේරු)	ඒ.කේ.ලසිත චඩ්මන්ඩි මයා	B.Sc. (Engineering)
කළමනාකාර (මිළදීගැනීම් හා නාවුක)	ටී.අරුණ ද සිල්වා මයා	
කළමනාකාර (තොරතුරු තාක්ෂණ)	ඒ.ජී.මාදුවගේ මයා	
කළමනාකාර (ආරක්ෂක)	චම්න්ද වීරමන් මයා	
කළමනාකාර (සිල්පර හා විදුලිකණු)	ඩී.එම්.පී.පුෂ්පකුමාර හිල්මිණි මයා	BSc
කළමනාකාර (මුදල්) (වැ/අ)	යූ.එස්.මඩවල මයා	HNDA, MAAT

ප්‍රාදේශීය කළමනාකරුවන්		
ප්‍රාදේශීය කළමනාකාර (ප්‍ර.කාර්යාලය)	ආර්.විජේතුංග මයා	B.Sc. (Agri.)Sp
ප්‍රාදේශීය කළමනාකාර (ප්‍ර.කාර්යාලය)	එම්.ඩී.සී.සම්පත් මයා	BA
ප්‍රාදේශීය කළමනාකාර (කොළඹ)	එච්.පී.එස්.දිසානායක මයා	BA
ප්‍රාදේශීය කළමනාකාර (මොණරාගල)	එම්.කේ.ජී.වසන්තරාජ් මයා	
ප්‍රාදේශීය කළමනාකාර (අනුරාධපුර)	එච්.එල්.නන්දන මයා	B.Sc.
ප්‍රාදේශීය කළමනාකාර (අම්පාර)	යූ.පී.එච්.උළුවඩුගේ මයා	B.Sc.
ප්‍රාදේශීය කළමනාකාර (රත්නපුර)	ඩී.එච්.රාජපක්ෂ මයා	M.Sc.(Forestry),B.Sc.
ප්‍රදේශීය කළමනාකාර (යාපනය)	එස්. ස්කන්ධරාජා මයා	
ප්‍රාදේශීය කළමනාකාර (කුරුණෑගල)	යූ.එස්.එම්.ප්‍රනාන්දු මයා	BA (Sp)
ප්‍රාදේශීය කළමනාකාර (මාතර)	ඩබ්.අයි.සාරංග මයා	B.Sc. (Hon.), MSc (Forestry)
ප්‍රාදේශීය කළමනාකාර (මින්නේරිය) (වැ/ආ)	ඩී.එල්.අබේනායක මයා	
ප්‍රාදේශීය කළමනාකාර (මහනුවර) (වැ/ආ)	ඩී.ඒ.හෙන්දාවිතාරණ මයා	Dip. in Forestry
ප්‍රාදේශීය කළමනාකාර (බණ්ඩාරවෙල) (වැ/ආ)	සුනිල් ජයරත්න මයා	
ප්‍රාදේශීය කළමනාකාර (නුවරඑළිය) (වැ/ආ)	ඩබ්.ඩී.පී.ජී.ජයසේකර මයා	

නියෝජ්‍ය කළමනාකරුවන්		
නියෝජ්‍ය කළමනාකාර (නීති)	කේ.අයි.ඩී.පී.කාරියවසම් මිය	LLB, Attorney at Law
නියෝජ්‍ය කළමනාකාර (නිර්මාණ හා තත්ව පාලක)	ඊ.එම්.එම්.ප්‍රනාන්දු මිය	
පද්ධති විශ්ලේෂක	ඩබ්.එච්.ඒ.චන්ද්‍රකුමාර මයා	B.Sc.
පද්ධති විශ්ලේෂක	ජේ.එම්.එම්.බී.ජයසුන්දර මයා	B.Sc. (Sp) Hon.
නියෝජ්‍ය කළමනාකාර(මානව සම්පත්)	එච්.පී.පෙරේරා මිය	
නියෝජ්‍ය කළමනාකාර(මානව සම්පත්)	කේ.එස්.අබේනායක මිය	
නියෝජ්‍ය කළමනාකාර(මුදල්) - නුවර	එච්.එම්.පී.බී.හේරත් මයා	
නියෝජ්‍ය කළමනාකාර(මුදල්) - බුස්ස	ඒ.එල්.ඩබ්.තුෂාර ද සිල්වා මෙනවිය	HNDA, MAAT
නියෝජ්‍ය කළමනාකාර(මුදල්) - නුවරඑළිය	එන්.ටී.එස්.කේ.පී.තිලකවර්ධන මයා	HNDA, MAAT
නියෝජ්‍ය කළමනාකාර(මුදල්) - යාපනය	ඩබ්.එම්.ජී.එම්.විජේසිංහ මයා	B.Sc. (Bus.Admin.) MAAT.
නියෝජ්‍ය කළමනාකාර(මුදල්) - මොණරාගල	ඒ.පේ.පුෂ්පකුමාර මයා	B.Sc. (Bus.Admin)
නියෝජ්‍ය කළමනාකාර(මුදල්) - මින්නේරිය	එම්.ඩී.පී.එම්.දිසානායක මයා	B.Sc. (Acc)
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) - (ප්‍ර.කා)	ඩී.එන්.විජේසූරිය මිය	B.Sc. (Acc), CTA.
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) - (ප්‍ර.කා)	එස්.විතානගේ මිය	
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) - අනුරාධපුර	ඩබ්.කේ.ජයසිංහ මිය	
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) - කොළඹ	එස්.පී.ඒ.ජේ.සී.සමරකෝන් මයා	B.Sc. (Finance)
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) - බණ්ඩාරවෙල	එස්.එම්.හේවගේ මයා	B.BA (Bus.Econ.)
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) - කල්දෙමුල්ල	ඩබ්.ඒ.එල්.එස්.පෙරේරා මිය	
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) - කුරුණෑගල	එස්.එච්.අයි.ප්‍රසාද් මයා	B.BA (Bus.Econ.)
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) - කැප්පෙටිපොළ	ඩී.කේ.ජී.ජී.පුෂ්පකුමාර මයා	
නියෝජ්‍ය කළමනාකාර (අලෙවි)	ඩබ්.ඩී.ඒ.එස්.තිලකරත්න මයා	
නියෝජ්‍ය කළමනාකාර (දැව ශ්‍රේණි කිරීම්)	ඩී.පී.කේ.එස්.ජී.සමරවික්‍රම මයා	B.Sc. (Mkt.Mgt.)
නියෝජ්‍ය කළමනාකාර (දැව සැපයුම්)	බී.ඒ.නලින් දේශප්‍රිය මයා	
නියෝජ්‍ය කළමනාකාර (ගෘ.භා.නිර්මාණ)	එච්.එම්.ටී.එස්.අබේරත්න මිය	B.Desing (Hon.) MBA
නියෝජ්‍ය කළමනාකාර (දැව ඉරුම්හල්)	එම්.පී.එන්.අරුණ ශාන්ත මයා	B.Sc. (Bus.Admin.)

නියෝජ්‍ය කළමනාකාර (විමර්ශන)	එස්.ඒ.ඩී.හිරෝෂන් මයා	B.Sc. (Bus.Mgt.)
නියෝජ්‍ය කළමනාකාර (යාන්ත්‍රික ඉංජිනේරු)	එම්.කේ.එම්.අත්හාර් මයා	B.Tech.
නියෝජ්‍ය කළමනාකාර (තත්ව ආරක්ෂණ)	එච්.එම්.එල්.ඊ.ගුණසේකර හේරත් මයා	B.Sc.
නියෝජ්‍ය කළමනාකාර (තත්ව ආරක්ෂණ)	ඩබ්.එම්.අයි.එච්. වීරසූරිය මයා	B.Sc.
නියෝජ්‍ය කළමනාකාර (නිෂ්පාදන)	අයි.එම්.ජේ.එස්.කේ.වික්‍රමසිංහ මයා	PgD.Fin. & Mathematics, B.Sc.

ගෘහභාණ්ඩ සංකීර්ණ කළමනාකරුවන්		
නියෝජ්‍ය කළමනාකාර (වැ/ආ) - අම්පාර	එන්.පී.එස්.ඩබ්. ජයරත්න මයා	
නියෝජ්‍ය කළමනාකාර - කල්දෙමුල්ල	එච්.එම්.යූ.පී.සෝමවීර මයා	BLE, Dip. IT & M
නියෝජ්‍ය කළමනාකාර - බුස්ස	ආර්.එස්.පල්ලියගේ මයා	B.Sc. (Bus.Admin)

නියෝජ්‍ය ප්‍රාදේශීය කළමනාකරුවන්		
නි.ප්‍රාදේශීය කළමනාකාර (බණ්ඩාරවෙල)	අයි.පී.ලියනගේ මයා	
නි.ප්‍රාදේශීය කළමනාකාර (මින්නේරිය)	කේ.එම්.පී.ටී.සී.කපිලරත්න මයා	
නි.ප්‍රාදේශීය කළමනාකාර (අම්පාර)	යූ.ජේ.පී.වීකනායක මයා	
නි.ප්‍රාදේශීය කළමනාකාර (මහනුවර)	ආර්.සී.සමන් කුමාර මයා	
නි.ප්‍රාදේශීය කළමනාකාර (නුවර)	ඩබ්.ඒ.එස්.විජේසේකර මයා	
නි.ප්‍රාදේශීය කළමනාකාර (යාපනය)	ටී.පී.රමේෂ් මයා	
නි.ප්‍රාදේශීය කළමනාකාර (රත්නපුර)	එච්.ඒ.ගාමිණි අල්විස්	
නි.ප්‍රදේශීය කළමනාකාර (ප්‍ර.කා)	එස්.සී.ජයමාන්න මයා	B.Sc.
නි.ප්‍රාදේශීය කළමනාකාර (මාතර)	කේ.චන්ද්‍රසේන මයා	
නි.ප්‍රාදේශීය කළමනාකාර (අනුරාධපුර)	එම්.ඩබ්.ඩබ්.බී.මුදන්නායක මයා	
නි.ප්‍රාදේශීය කළමනාකාර (කොළඹ)	ඊ.එම්.ඒ.කේ.එදිරිසිංහ මයා	
නි.ප්‍රාදේශීය කළමනාකාර (කොළඹ)	එස්.බී.උඩගෙදර මයා	BA
නි.ප්‍රාදේශීය කළමනාකාර (මොණරාගල)	පී.හෙට්ටිආරච්චි මයා	B.Sc.
නි.ප්‍රාදේශීය කළමනාකාර (කුරුණෑගල)	එස්.ඒ.මනෝජ් තුෂාර	
නි.ප්‍රාදේශීය කළමනාකාර (කුරුණෑගල)	ආර්.පී.පී.ඩී.ජයසිංහ	
නි.ප්‍රාදේශීය කළමනාකාර (කුරුණෑගල)	එස්.එම්.එස්.සිරිවර්ධන	

ශ්‍රී ලංකාවේ පයිනස් වන වගා

ශ්‍රී ලංකාව තුල 1870 දශකයේදී වන වගා ස්ථාපනය ආරම්භ විය. එතැන් සිට මේ දක්වා සැළකියයුතු බිම් ප්‍රමාණයක වන වගා ස්ථාපනය කර තිබේ. මෙම වන වගා සඳහා තේක්ක, යුකැලිප්ටස්, පයිනස් සහ මැහෝගනී යන ශාක විශේෂ යොදාගන්නා ලදි. කේතුධර ශාකයක් සැළකෙන පයිනස් වන වගා කිරීම ශ්‍රී ලංකාව තුල 1960 -1990 අතර කාලපරාසය තුල සිදුවිය. කඩදාසි කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සහ ජල පෝෂක ප්‍රදේශයේ පිරිහෙන ඉඩම් වල වනාන්තර ආවරණයක් ඇති කිරීම සඳහා 1967 දී ඒවා මහා පරිමාණයෙන් සිටුවීමට පටන් ගත්හ. මේ වන විට ශ්‍රී ලංකාවේ තෙත් සහ අතරමැදි කලාප වල හෙක්ටයාර 16,000 ක පයිනස් වගාවක් ඇත. කඳුකර ප්‍රදේශ වල දක්නට ලැබෙන පයිනස් වගාවේ වතු වගාව නොපවතින හෙයින් ජල පෝෂක සංරක්ෂණයට එහි දායකත්වය අවම වේ.

පයිනස් ශාකය සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාව තුල මීටර 30-40 උසට සහ පපු මට්ටමේ විෂ්කම්භය සෙන්ටිමීටර 40-50 පමණට වර්ධනය වේ. සෘජු කඳන් දරන අතර වසර 100 කට වැඩි ආයු කාලයක් පෙන්නුම් කරයි. ආරම්භයේදී මෙම පයිනස් වන වගා උඩරට ප්‍රදේශයේ හායනයට පත්වූ වියළි සහ පතන භූමිවලටද පහත රට තෙත් සහ අතරමැදි කලාපයේ කැකිල්ල භූමිවලටද සීමාවිය.

ශ්‍රී ලංකාවට පයිනස් විශේෂ කිහිපයක්ම හඳුන්වාදී තිබේ. ඉන් විශේෂ දෙකක් මහා පරිමාණ භාවිතය සඳහා තෝරා ගන්නා ලදි. එනම්,

- *Pinus caribaea var. hondurensis*
- *Pinus patula*



වාර්ෂික වාර්තාව
රාජ්‍ය දැව සංස්ථාව

- සභාපතිතුමාගේ පණිවිඩය
- සාමාන්‍යාධිකාරීතුමාගේ පණිවිඩය
- අපගේ කාර්යභාරයන්
- අපගේ ව්‍යාපාරික වටිනාකම්
- අධ්‍යක්ෂ මණ්ඩලය - 2020
- ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මඩුල්ල - 2020



සභාපතිතුමාගේ සමාලෝචනය

"කොවිඩ් - 19 වසංගතය වසර පුරා බාධා ඇති කළ ද, දැව සංස්ථාවේ කටයුතු කෙරෙහි සැළකිය යුතු මට්ටමින් බලපාන බාහිර ඍණාත්මක බලවේග තිබියදීත්, මහා භාණ්ඩාගාරයට රු.මිලියන 511 ක මුදලක් බදු වශයෙන් ලබාදීමට අප සංස්ථාව ස්ථාවරව හා ශක්තිමත්ව කටයුතු කළ බව සාඩම්බරයෙන් ප්‍රකාශ කරමු."



රාජ්‍ය දැව සංස්ථාව සඳහා 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයෙහි වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට සභාපතිවරයා ලෙස මම සතුටු වෙමි. වසර පුරා අපගේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා ශ්‍රම බලකායේ අනුවර්තනයවීමේ හැකියාව සහ නම්‍යතාවය මූලික විය.

කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ඇති වූ ගෝලීය සෞඛ්‍ය අර්බුදය ජීවිත හා ජීවනෝපායන් කෙරෙහි පමණක් නොව ලොව පුරා ආර්ථිකයන්ට පෙර නොවූ විරූ බලපෑමක් ඇති කළ අතර, එහි ප්‍රතිඵල හා ප්‍රතිවිපාකවලට මුහුණදීම සඳහා සැළකිය යුතු කාලයක් ගතවනු ඇත. 2019 වර්ෂයේ සිදු වූ පාස්කු ප්‍රහාරයෙන් ඇති වූ බලපෑමෙන් පසු ලංකාවෙහි ආර්ථිකය යථා තත්ත්වයට පත්වෙමින් පැවති අවධියක කොවිඩ් 19 වසංගතය අපගේ ඔරොත්තුදීමේ හැකියාව තවදුරටත් පරීක්ෂා කිරීමෙන් හා පෙර වර්ෂයේ පැවති ආර්ථික පසුබෑමෙහි මට්ටමට රට නැවත ගෙන එමින් විශාල හා පෙර නොවූ විරූ බලපෑමක් ඇති කළේය. එවැනි පසුබිමක මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම හා ප්‍රගතියක් ලබාගැනීම සංස්ථාව සඳහා දුෂ්කර කටයුත්තක් විය. වසංගතයේ බලපෑම තිබියදීත්, අප සංස්ථාවෙහි දූරදර්ශී හා ක්‍රියාශීලී ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා 11% ක ලාභ වර්ධනයක් සහිතව රුපියල් මිලියන 570 ක බදු පෙර ලාභයක් වාර්තා කිරීමට අප සංස්ථාව සමත් වී ඇත. රාජ්‍ය දැව සංස්ථාව තුළ ආරක්ෂක පියවරයන් සහ ප්‍රමිතීන් සඳහා සෑම විටම විශාල වැදගත්කමක් ලබා දී ඇත. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සෞඛ්‍ය අමාත්‍යංශය විසින් නියම කර ඇති මාර්ගෝපදේශ පවත්වා ගනිමින් දැඩි කොවිඩ් 19 ආරක්ෂාකාරී ක්‍රියා පටිපාටි ඇතුළත් කරමින් අපගේ ආරක්ෂක පියවරයන් සහ ප්‍රමිතීන් තවදුරටත් ඉහළ නංවන ලදී.

2020 වර්ෂය අපගේ මූලික ශක්තීන්, නව්‍ය හා උසස් තත්ත්වයේ නිෂ්පාදනයන් කෙරෙහි විශාල වශයෙන් අවධානය යොමු කළ වසරකි. නව සාමාන්‍ය තත්වයන් යටතේ අපගේ මෙහෙයුම් කටයුතු 2020 අප්‍රේල් මසදී දැඩි ආරක්ෂක පියවරයන් සහ අභිප්‍රේරිත කාර්ය මණ්ඩලයක් සමඟ ආරම්භ විය. ඒ අතරම අපි නැවත වරක් අපගේ පාරිසරික හා සමාජ සංස්කෘතික කාර්ය සාධනය ඉහළ මට්ටමකින් පුළුල් කළෙමු.

මානව සම්පත යනු අප සංස්ථාව සතු ඉතා වටිනාම සම්පත බව අපගේ විශ්වාසයයි. අපගේ ගනුදෙනුකරුවන්ට හැකි උපරිම මට්ටමින් සේවය කිරීමට කැපවී සිටින හා සංස්ථාවේ ඉලක්ක සපුරාගැනීමට තම කාර්ය නොපිරිහෙලා ඉටුකරන අපගේ කාර්ය මණ්ඩලයේ පුහුණු හා සංවර්ධන වැඩසටහන් සඳහා 2020 වර්ෂයේ දී ද අප ආයෝජනය කළෙමු.

මූල්‍ය කාර්යසාධනය

-3.6% ක ආර්ථික වර්ධනයක් යටතේ වුවද රුපියල් මිලියන 3892ක අලෙවි ආදායමක් ළඟාකර ගැනීමට සංස්ථාවට අවස්ථාව උදා වූ නමුත්, පෙර වර්ෂයේ රුපියල් මිලියන 4282 ක් වූ අලෙවි ආදායම සාපේක්ෂව මෙය සුළු වශයෙන් අඩුවීමකි. කෙසේ වුවද, මෙම පසුබෑම තුළ පවා බදු පෙර



ලාභය රුපියල් මිලියන 570 ක් හා බදු පසු ලාභය රපියල් මිලියන 464 ක් ලෙස වාර්තා කිරීමට රාජ්‍ය දැව සංස්ථාවට හැකිවීම කැපී පෙනේ. මේ අනුව 2019 වාර්තාව හා සසඳන විට බදු පෙර ලාභය සහ බදු පසු ලාභය පිළිවෙලින් 11% සහ 46% කින් ඉහළ ගොස් තිබේ. කෙසේ වෙතත්, රජය සතු සංස්ථාවක් (ආයතනයක්) ලෙස මෙම දුෂ්කර කාලසීමාව තුළ ඉහළ ගිය බදු ගෙවීමෙන් පසු ලාභයෙන් මිලියන 511 ක බද්දක් ලබාදීමට හැකිවීම පිළිබඳ අපි ආඩම්බර වෙමු.

වී හා සමානව, භාණ්ඩාගාර බදු පෙර හා ආදායම් බදු පසු සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ (ROA) 2020 වර්ෂයේ දී 6% ක් ලෙස වාර්තා වන අතර,



එය 2019 වර්ෂයේ අගය එනම් 4.4% ට සාපේක්ෂව ඉහළ යෑමකි. 2019 වර්ෂයේ දී 5.7% ලෙස වාර්තා වූ භාණ්ඩාගාර බදු පෙර හා ආදායම් බදු පසු සාමාන්‍ය කොටස් මත ප්‍රතිලාභ ද (ROE) 2020 වර්ෂයේ දී 8% දක්වා වර්ධනය වී ඇත. සියලු වත්කම් හා කොටස් ආදායම උත්පාදනය සඳහා විශාල දායකත්වයක් ලබාදී ඇති බව හා සංස්ථාව සුදුසු කාරක ප්‍රාග්ධන කළමනාකරණ ප්‍රතිපත්තියක් පවත්වාගෙන යන බව ඉන් පිළිඹිබු වේ.

ඉදිරි මාවත

කොවිඩ් 19 වසංගතය ලොව පුරා අවිනිශ්චිතතාවයක් අඛණ්ඩව ඇති කරමින් සිටින බැවින් සංස්ථාව දැව කර්මාන්තය සහ සමස්තයක් වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය උදෙසා ඉදිරි වර්ෂයේ දී ඇතිවිය හැකි බාධක නොතකා නොපසුබට උත්සාහය හා වර්ධනයක් ළඟා කරගැනීමට අප තුළ ඇති නොසැලෙන හැකියාව මත අපි ශක්තිමත්ව සිටින්නෙමු. නව විශ්වාසයකින් යුතුව අපි ඉදිරි ගමනකට අවශ්‍ය පරිදි අනුවර්තනය වී ඉදිරි වසර සඳහා අප විසින් සකස් කර ඇති ඉලක්ක කරා ළඟා වෙමු.

අපි අභියෝගාත්මක නව වසරකට පිවිසෙන බැවින් සංස්ථාව මගින් නිරතුරුව තත්ත්ව විශ්ලේෂණයන් සිදුකරනු ලබන අතර, එම විශ්ලේෂණයන්හි ප්‍රතිඵල මත පෙර සකස් කරන ලද සැළසුම් සමාලෝචනය කරන්නෙමු. නමුත් පසුගිය වසරවල සාර්ථකත්වය ගෙන ඒමේ ක්‍රියාවලියේ දී වැදගත් ලෙස සනාථ වූ සංස්ථාවෙහි ශක්තිමත් පදනම, ශක්තිමත් උපාය මාර්ග මෙන්ම ව්‍යාපාර ආකෘතිවල ඔරොත්තුදීමේ හැකියාව සහ ක්‍රියාශීලී බව, ඉදිරි අභියෝග ජයගැනීමට රාජ්‍ය දැව සංස්ථාවට ඉවහල් වනු ඇති බවට අප විශ්වාස කරමු.

අපගේ මූලික ව්‍යාපාරය ගොඩනැඟීමට හා වර්ධනය කිරීමට ඇති අවස්ථාවන් උපයෝජනය කරමින් අභියෝගයන්ට සාර්ථකව මුහුණදීමට රාජ්‍ය දැව

සංස්ථාවට හැකියාව හා පෙර සූදානම ඇති බව මාගේ විශ්වාසයයි. ඒ අතරම අපගේ වර්ධන ගමනට මග සළසන අපගේ වෙළෙඳ නාමය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ආයෝජනයන් හා අපගේ සාර්ථකත්වයට ඉවහල් වන ශේෂ පත්‍රයෙන් පරිබාහිර සාධක ද ශක්තමත් කිරීමට අපි අපේක්ෂා කරන්නෙමු. "අපගේ පාර්ශවකරුවන් සඳහා අප විසින් නිර්මාණය කරනු ලබන වටිනාකම් තවදුරටත් ඉහළ නැංවීමේ අපේක්ෂාව" විසින් අපව ඉදිරියටම මෙහෙයවනු ලබන බව මම අවධාරණය කරමි. එම අපේක්ෂාවට අනුගාමීව සමාජීය හා පාරිසරික වගකීව යුතු සංවිධානයක් ලෙස අපගේ අනන්‍යතාවය ශක්තිමත් කිරීමට කටයුතු කරන අතරම, අපගේ පාර්ශවකරුවන් හට තිරසාර වටිනාකමක් ලබාදීම සහතික කිරීම සඳහ රාජ්‍යදැව සංස්ථාව සිය පූර්ණ අවධානය යොමු කරනු ඇත.

මාගේ කෘතඥතාවය

සංස්ථාව ස්ථායී ස්ථාවරයකට ගෙන ඒම සඳහා කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය අඛණ්ඩව දායකත්වය සැපයීම පිළිබඳව මාගේ අවංක ස්තූතිය පිරිනැමීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. දැව හා දැව පදනම් කරගත් නිෂ්පාදන භාවිතා කරන අපගේ වටිනා ගනුදෙනුකරුවන්ට මාගේ අවංක කෘතඥතාවය පළ කරමි.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ගරු වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාටත්, රාජ්‍ය අමාත්‍යතුමාටත් අමාත්‍යංශ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, වනසංරක්ෂණ ජනරාල්තුමා ඇතුළු එම දෙපාර්තමේන්තුවට අනුයුක්ත සියලු කාර්ය මණ්ඩලයටත් අනෙකුත් සියලු රජයේ නිලධාරීන්ටත්, අපහට ලබාදුන් සහයෝගය වෙනුවෙන් කෘතවේදීත්වය පුදකිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

2020 වර්ෂය පහසු වර්ෂයක් නොවූවත් එම වර්ෂය තුළදී ලබාගත් අත්දැකීම් මුල්කරගෙන ඉදිරි වර්ෂ සඳහා සාර්ථකව මුහුණදීමේ අභිලාෂයෙන් කටයුතු කිරීම අපගේ අදිටනයි. අපගේ පාර්ශවකරුවන්ට හැකි උපරිම කැපවීමෙන් හොඳ ප්‍රතිලාභයක් ලබාදීමට මම සැමවිටම ඇපකැප වී සිටිමි.



උදය සී. වලිසිංහ
සභාපති
රාජ්‍ය දැව සංස්ථාව

මධ්‍යම ඇමරිකාව නිජබිම කරගත් *Pinus caribaea var hondurensis* විශේෂය පුළුල් පාංශු සහ දේශගුණික පරාසයක් තුල ඉතා සාර්ථකව වර්ධනයවේ. මෙම විශේෂය ශ්‍රී ලංකාව තුල මීටර 900-1600ත් අතර උච්චත්වයන්ට වඩාත් යෝග්‍යවේ. මෙක්සිකෝව නිජබිම කරගත් *Pinus patula* විශේෂය *Pinus caribaea var hondurensis* විශේෂයට සමානකම් දක්වන අතර මීටර 1600ට වැඩි උච්චත්වයන් යටත් වර්ධනයවේ. මෙම පයිනස් විශේෂ දෙක තෘණ විශේෂ සහ පැලෑටි විශේෂ සමඟ හොඳින් තරඟකරන බැවින් පතන බිම් සඳහා වඩාත් යෝග්‍යය.

උඩරට,මැද රට සහ පහත රට තෙත් කලාපයේ පහළ උච්චත්වයන් සඳහා *Pinus caribaea var hondurensis* ද ඉහළ උච්චත්වයන් සඳහා *Pinus patula* ද භාවිතා වේ. උඩරට ප්‍රදේශයේ පයිනස් වගාකිරීමේ අරමුණු වූයේ ජලාධාර සංරක්ෂණය සහ දැව නිෂ්පාදනයයි. 1980 දශකයේදී ඉහළ ජල පෝෂක ප්‍රදේශවල ආරක්ෂාව සඳහා පයිනස් වගාකරන ලදි. ඒ අනුව පාංශු බාදනය වැළැක්වීම, රොන්මඩ තැන්පත්වීම වැළැක්වීම, වියළි කාලයේදී පහළ උච්චත්වයකින් පිහිටි ජලාශ කරා ජලය ගලායෑම තහවුරු කිරීම යනාදිය අපේක්ෂා කරන ලදි. අනෙකුත් ප්‍රදේශවල පයිනස් වගාකිරීමෙන් අපේක්ෂා කරන ලද්දේ ස්වභාවික වනාන්තර වටා ස්වාරක්ෂක කලාපයක් ඇති කිරීමයි. මෙයට අමතරව නාගරික වනාන්තර ඇතිකිරීමේ දී පයිනස් වගාවේ තිබෙන සෞන්දර්යාත්මක බව උපයෝගී කරගැනීමක්ද දක්නට ලැබුණි.



සාමාන්‍යාධිකාරි (ප්‍රධාන විධායක නිලධාරි) සමාලෝචනය

"රාජ්‍ය දැව සංස්ථාව විසින් වෙළෙඳපොළට සපයනු ලබන නිෂ්පාදන පරාසය විවිධාංගීකරණය කිරීම සඳහා අගය එකතු කිරීම් මත ආයෝජනය කරන අතරම, ඉහළ ගුණාංගවලින් යුතු පයිනස් දැව නිෂ්පාදන සඳහා දේශීය සහ අපනයන වෙළෙඳපොළ පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කරයි."

රාජ්‍ය දැව සංස්ථාවේ සාමාන්‍යාධිකාරි (ප්‍රධාන විධායක නිලධාරි) වශයෙන්, 2020 වාර්ෂික වාර්තාව සඳහා පණිවිඩයක් තැබීමට හැකිවීම ගැන මම සතුටු වෙමි. පසුගිය වසරේ මාගේ පණිවුඩයේ සඳහන් කර ඇති පරිදි අපහසු තත්වයන් මධ්‍යයේ වුවද, 2020 වසර සඳහා ද රාජ්‍ය දැව සංස්ථාවේ සෑම අංශයකින්ම විශිෂ්ට ප්‍රතිඵල ලබාගැනීමට අවැසි නායකත්වය ලබාදීමට හැකිවීම පිළිබඳ මම ඉතාමත් තෘප්තිමත් වෙමි.

කොවිඩ්-19 වසංගතය තුළ ලද ජයග්‍රහණය

ලොව පුරා පැතිරී ගිය කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2020 වසර මාගේ සේවා කාලය තුළදී මෙතෙක් මට හමු වූ ඉතාමත් අභියෝගාත්මක මෙන්ම අභිප්‍රේරණාත්මක වසර විය. මාගේ ජීවිත කාලය තුළ මෙන්ම සේවා කාලය තුළ මෙවැනි අනපේක්ෂිත තීරණාත්මක කාලපරිච්ඡේදයකට මුහුණදීමට මම කිසිසේත් බලාපොරොත්තු නොවුයෙමි. කොරෝනා වසංගතය හේතුවෙන් පසුගිය වසරේ සිටම මේ දක්වා මුළු ලෝකයම ශෝකජනක තත්වයකට මුහුණ දී ඇති අතර, එය සමස්ථ ව්‍යාපාරවල මූල්‍යමය සහ මෙහෙයුම් ක්‍රියාවලීන් කෙරෙහි සැළකිය යුතු ලෙස බලපෑවේය. එවැනි දුෂ්කර කාලයකදී වුවද, සේවකයින්ගේ කාර්යසාධනය සහ කැපවීම නිසා අපේක්ෂිත ප්‍රතිසාධන වේගයට වඩා වැඩි වේගයෙන් සැළසුම් කරන ලද ඉලක්ක කරා ළඟාවීමට හැකි වූ බවට රාජ්‍ය දැව සංස්ථාව සාක්ෂි දරනු ඇත.

නිරෝධායනය සඳහා වූ හදිසි රෙගුලාසි දරාගැනීමට සිදු වූ අතර, අපගේ කාර්ය මණ්ඩලය ආරක්ෂිතව හා සෞඛ්‍ය සම්පන්නව සිටින බව සහතික කරන අතරම, අපගෙන් බලාපොරොත්තු වූ ජාතික සේවාව සැපයීමේ දී කිසිදු කඩාවැටීමකින් තොරව අපගේ කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා අපගේ ව්‍යාපාර සැලැස්මට නව ක්‍රමෝපායන් සකස් කළ යුතු විය. 2020 අප්‍රේල් සිට මැයි මස මැද දක්වා දීපව්‍යාප්ත පැවති ඇඳිරිනීතිය හේතුවෙන් සහ සෙසු කාලසීමාවන් තුළ වරින්වර ප්‍රදේශයන් හුදකලා කිරීම් සඳහා පියවර ගැනුනද, රාජ්‍ය දැව සංස්ථා සේවකයින් කොවිඩ්-19 අවධානම දරා ගනිමින් ඉතා ආරක්ෂිතව සහභාගී වී ලාභ උපයාගැනීමට සහ ඉලක්ක සපුරාගැනීමට කටයුතු කළහ. රාජ්‍ය දැව සංස්ථාව වෙනුවෙන් මම විශේෂයෙන් ම ඔවුන් හට හිස නමා ආචාර කළ යුතු අතර, ඔවුන්ට ගෞරව කළ යුතුය. අපගේ සියලු සේවකයින්ගේ ධනාත්මක ආකල්පයන් නිසාවෙන් මෙලෙස පෙර නොවූ විරූ සහ අස්ථාවර කාලපරිච්ඡේදයක් තුළ වුවද, නොයෙකුත් අභියෝගයන්ට මුහුණ දෙමින් ඉතාමත් යහපත් කාර්යසාධනයකින් යුතුව ඉදිරියට යාමට හැකි වූ බව මම විශ්වාස කරමි. සාමාන්‍ය තත්වයෙන් ඔබ්බට අපගේ සැබෑ ශක්තීන් හා අවස්ථා අප විසින් සොයාගැනීමට හැකි වූ කාලපරිච්ඡේදයක් විය. වෛරස් රෝගයට ගොදුරුවීම සහ කාර්ය මණ්ඩලය සංකලනයවීම අවම කිරීම සඳහා නිවසේ සිට හෝ නිවසට ආසන්නව වැඩ කිරීම ආදී ක්‍රියාමාර්ග අනුග මනය කරන ලදී. එමගින් අපගේ කාර්ය මණ්ඩලය වසංගතයෙන් ආරක්ෂා වූ අතර, එය සාර්ථකව කළමනාකරණය කළෙමු. විශේෂයෙන් ඉතාමත් අභියෝගාත්මක මෙම අවස්ථාවේ දී රාජ්‍ය දැව සංස්ථා පාරිභෝගිකයින් හට සේවය සැපයීමේදී ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කළ අපගේ ඉදිරිපෙළේ සේවයේ නියුතු වූ සහ දායකත්වය දැක් වූ සියලුදෙනා වෙනුවෙන් නැවත වරක් මම ස්තුති කරමි. නව වැඩ කිරීමේ ක්‍රම වෙත කඩිනමින් මාරුවීමේදී මෙන්ම සහනදායී ලෙස පිරිවැය පාලනයක් පවත්වා ගැනීමට ඵලදායී අන්දමින් ක්‍රියාත්මක වීමේදී ඔවුන් ලබාදුන් සහය සහ කැපවීම මූල්‍ය ස්ථායීතාව පවත්වාගැනීමට උපකාරී විය. කොවිඩ්-19 සඳහා රජය විසින් ආරම්භ කරන ලද විශේෂ අරමුදල සඳහා අප සේවකයන්ගෙන් ද එක් දින වැටුපක් ලබාදෙමින් පැවතුන ව්‍යසන තත්වය පාලනයට දායකවීම ගැන අපගේ සුපරීක්ෂාකාරී කාර්ය මණ්ඩලයට මම ස්තූතිවන්ත වෙමි.

ගත වූ වසර 52ක ඉදිරි ගමන

2020 වනවිට රාජ්‍ය දැව සංස්ථාවට වසර 52ක සාඩම්බර ඉතිහාසයක් ඇත. කීර්ති නාමය සමඟ බැඳී විශ්වාසනීයත්වය මෙම සාර්ථකත්වයට එක් හේතුවක් විය හැකි යැයි මම සිතමි. වර්තමානයේ රාජ්‍ය දැව සංස්ථාව ප්‍රාදේශීය කාර්යාල 12කින්, අලෙවි මධ්‍යස්ථාන 53කින් සහ තෙල්කැවීම් හා පරිරක්ෂණ ඒකකවලින් සමන්විත ගෘහ භාණ්ඩ නිෂ්පාදනාගාර 3කින් මෙන්ම නවීන තාක්ෂණය සහ අවශ්‍ය යටිතල පහසුකම් ඇතුළුව සැකසූ සහ ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනාගාර 8කින් සමන්විත වේ. දිගු කාලීන සැළසුම් සහ උපාය මාර්ග සමඟ දැනටමත් ජාතික මට්ටමේ සිට ජාත්‍යන්තර මට්ටමට අපේ නිෂ්පාදන හඳුන්වාදීමේ බලාපොරොත්තුවෙන් අපේ ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාර, ඉරුම්හල්, තෙල්කැවීම් හා පරිරක්ෂණ ඒකක, නවීන තාක්ෂණය සහ පහසුකම් සහිතව පුළුල් කිරීමටත් විතුළින් අපගේ නිෂ්පාදන වැඩිදියුණු කිරීමටත් අවශ්‍ය කටයුතු සැළසුම් කර ඇත. කෙසේ වෙතත්, රටේ දේශපාලන හා ආර්ථික පසුබිම තුළ අපට දිනෙන් දින මුහුණදීමට සිදුවන අභියෝග සමඟ එය විතරම් සුමට හා සරළ නොවන බව පැහැදිලිය.

මූල්‍ය දැක්ම ඉදිරියට ගෙනයාම

අඩුපාඩු, අභියෝග, ශක්තීන් සහ නව අනාගත අවස්ථා හඳුනාගැනීම සඳහා 2020 වසරේ ආයතනික ආදායම දෙස ආපසු හැරිබැලීම අත්‍යවශ්‍ය වේ. 2020 වසරේ දී රාජ්‍ය දැව සංස්ථාව උපයා ඇති මුදල රුපියල් මිලියන 3,982කි. 2019 වසර හා සසඳන විට එය සුළු පසුබෑමක් වුවද, බදු ගෙවීමට පෙර ලාභය රු.මිලියන 570ක් වූ අතර, බදු ගෙවීමෙන් පසු ලාභය වර්ෂය සඳහා රු.මිලියන 464කි. 2020 වර්ෂය සඳහා භාණ්ඩාගාරයට බද්ද වශයෙන් රු.මිලියන 511ක් ගෙවා ඇත. මෙවැනි අපහසු කාලවකවානුවක් තුළදී වුවද අපහට විශිෂ්ට ජයග්‍රහණයක් ලබාගැනීම සඳහා කළමනාකරණ මඩුල්ල සහ සහායක කාර්යමණ්ඩලය සමඟ සහයෝගයෙන් ආයතනය මෙහෙයවීමට හැකිවීම ගැන සාමාන්‍යාධිකාරි වශයෙන් මම ආඩම්බර වෙමි. කෙසේ වෙතත්, කොරෝනා වසංගතය සඳහා ඉදිරි වසර කිහිපය තුළදීත් නිවැරදි ඖෂධයක් නිෂ්පාදනය නොකළහොත් එය ලෝකයෙන් තුරන් කිරීමට නොහැකි වනු ඇත. එම නිසා ගත වූ වසරේ සිදුකළ ආකාරයටම ඉදිරියට එන තත්වයන් සඳහා ද ගැලපෙන නවක උපාය මාර්ගයන් අනුගමනය කිරීමට හෝ මැදිහත්වීම අත්හැර දැමීමට නොහැකිය.

විශ්වාසවන්ත ගුණාත්මක නිෂ්පාදන අබණ්ඩව පවත්වාගෙන යාම

මූල්‍ය කටයුතු පමණක් නොව පසුගිය වසරේ දී අපගේ මෙහෙයුම් හා මානුෂීය කටයුතු ද සාර්ථක විය. මේ දක්වාම ශ්‍රී ලංකාවේ දැව සැපයීමේ දී ප්‍රමුඛතාවය හිමිවූයේ රාජ්‍ය දැව සංස්ථාවටය. හෘදයාංගම ආයතනයක් ලෙස අනෙකුත් දැව කර්මාන්ත සමඟ තරඟකිරීම විශාල අභියෝගයකි. කෙසේ වෙතත්, කඳන්, ඉරුඳැව, සිල්පර, වැටකණු, අලිවැට, විදුලි කණු සහ ගෘහ භාණ්ඩ විකිණීමෙන් රාජ්‍ය දැව සංස්ථාව විශාල කාර්යයක් සිදුකර ඇත. සෑම වසරකම මෙන්ම 2020 ද කඳන්, ඉරුඳැව සහ සිල්පර වෙළෙඳාම හොඳින් ක්‍රියාත්මක විය. සුවපහසු, විශ්වාසදායක හා හොඳින් නිමකළ ආකර්ෂණීය ගෘහ භාණ්ඩ නිෂ්පාදන සඳහා රාජ්‍ය දැව සංස්ථාව තවමත් ජාතියේ විශ්වාසය දිනා ඇත. සාම්ප්‍රදායික ගෘහ භාණ්ඩ නිෂ්පාදනය මෙන්ම ෆින්ගර් ජොයින්ට් ගෘහ භාණ්ඩ නිෂ්පාදන සඳහා රාජ්‍ය දැව සංස්ථාව සෑම විටම ඉහළම ස්ථානය දිනා ඇත. නිත්‍ය පාරිභෝගිකයින් මෙන්ම නව පාරිභෝගිකයින් හට ද සාධාරණ මිලකට උසස් තත්ත්වයේ ගෘහ භාණ්ඩ අපගේ පාරිභෝගිකයන් වෙනුවෙන් හොඳම තත්වයේ සේවාව සමඟ ලබාදීමට හැකිවීම පිළිබඳ තෘප්තිමත් වෙමි. එමනිසා ඔවුන් සෑම විටම නිෂ්පාදන මිලදී ගැනීමේදී තමන් ගෙවන මිලට හොඳම නිෂ්පාදනයක් ලබාගනිමින් සාධාරණයක් කරගැනීම සඳහා අපගේ

ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනාගාර සමඟ සම්බන්ධවීමට උත්සාහ දරයි. තවද, වංචාවකින් තොරව ඔවුන් හට හොඳම තත්වයේ නිෂ්පාදන ලබාදීමට අපි සැමවිටම සහතික කරමු. මෙතෙක් රජයේ කීර්තිමත් ආයතනයක් වශයෙන් අපි සැමවිටම ලාභ ඉපැයීමට වඩා හොඳම සේවාව සපයන්නෙමු. කොවිඩ්-19 හමුවේ දුෂ්කර අවස්ථාවන්ට මුහුණදීමට සිදුවුවද, කිසි විටෙකත් පාරිභෝගිකයන්ගේ විශ්වාසය බිඳ නොදැමූ අතර ඉදිරියටත් එය කෙසේ හෝ සුරකින බවට සහතික කරමි.

විද්‍යාත්මක රාමුව තුළින් ගුණාත්මක සේවාවක් සැපයීම.

මීට අමතරව අපේ සේවකයින් දැව ආශ්‍රිත පර්යේෂණ අධ්‍යයනයන් කිහිපයක් සිදුකළ අතර, පසුගිය වසර තුළ ගමන්බිමන් සඳහා වැයකරන කාලය නාස්ති නොකර, එම කාලය උපරිම ප්‍රයෝජනවත්ව යොදවා නිවසේ සිට Zoom තාක්ෂණය හරහා සම්මන්ත්‍රණවලට සම්බන්ධ වෙමින් එම පර්යේෂණවලට අදාල පර්යේෂණ ලිපි ප්‍රකාශයට පත් කෙරුණි. කෙසේ වෙතත් එය සාර්ථක විය. රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරකම් සහ එහි ක්‍රියාවලීන් විද්‍යාත්මක සංකල්ප හා පසුබිම්වලට අනුකූල බැවින් සෑම විටම ශ්‍රී ලංකාවේ දැව පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයන් සිදුකරන ලදී. දැව හඳුනාගැනීම, දැව පදමිකිරීම සහ පරිරක්ෂණය කිරීම සම්බන්ධව රසායනාගාර පරීක්ෂණ සිදුකිරීමෙන් පසු සහතික පත්‍ර වාර්තා අදාල බලධාරීන්ට ලබාදෙන බලයලත් විකම ආයතනය ලෙස ද රාජ්‍ය දැව සංස්ථාව කටයුතු කරයි. 2020 දී දැව ආශ්‍රිත සහතික වාර්තා 207 ක් නිකුත් කිරීමට අපට හැකි විය.

බලයලත් රජයේ ආයතනය වශයෙන් අපි පරිසරය, වනාන්තර, දැව හඳුනාගැනීම සහ තිරසාර ලෙස දැව භාවිතය පිළිබඳව පාසැල් දරුවන් දැනුවත් කිරීමට බැඳී සිටිමු. වගකිව යුතු දැනුමක් ඇති පාර්ශවයක් වශයෙන් රාජ්‍ය දැව සංස්ථා නිලධාරීන් විවිධ පුහුණු වැඩසටහන් මෙන්ම මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සම්පත්දායකත්වය ලබාදෙමින් දායක විය. කොවිඩ්-19 හේතුවෙන් මහජනතාව දැනුවත් කිරීමේ වැඩමුළු හා රැස්වීම්වලින් වැළැකී සිටිය යුතු බැවින් මුහුණට මුහුණලා සම්මන්ත්‍රණ හෝ පුහුණු වැඩසටහන් පැවැත්වීම බාධාවක් විය. නමුත් මේ සියලු තත්වයන් යටතේ සේවකයින් 654 දෙනෙකුට ඔවුන්ගේ වෘත්තිය කුසලතා, මෘදු කුසලතා සහ ඔවුන්ගේ විෂය දැනුම වැඩිදියුණු කිරීමට පුහුණු වැඩසටහන් සඳහා යොමුකරවීමට අපට හැකි විය. ඊට අමතරව 2020 වර්ෂයේ දී පරිසර අමාත්‍යාංශයේ සහයෝගයෙන් විද්‍යා ගුරුවරුන් 150ක් ගාල්ල කලේගානේ දී පරිසර විද්‍යාව සඳහා පුහුණු කරන ලදී.

සේවකයින්ගේ දියුණුව සඳහා වූ අභිලාෂයන් සහතික කිරීම.

සේවක උසස්වීම්, ස්ථාන මාරුවීම් විනිවිදභාවයෙන් හා සාධාරණව සිදු වූ අතර, මෙම වසරේදී ද සේවකයින්ගේ රැකියා සුරක්ෂිතතාව තහවුරු කරමින් සේවක විශ්වාසය ගොඩනගන ලදි. ආයතනයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී පැන නැඟෙන ගැටළු විසඳීම සඳහා පළපුරුද්දක් ඇති විධායක නිලධාරීන්ගේ පහසු මෙන්ම දුෂ්කර කාලය තුළ කාලෝචිත තීරණ ගැනීම, කැපවීම සහ උත්සාහය සංස්ථාව් සාර්ථකත්වයේ ඇති අනෙක් වැදගත් රහසයි. බොහෝ අභියෝග මධ්‍යයේ කළමනාකාරිත්වය හා කාර්ය මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සහයෝගයෙන් කටයුතු කළ ආකාරය අපි අගය කොට සළකමු.

අනාගත උපාය මාර්ග

වර්තමානයේ රාජ්‍ය දැව සංස්ථාව දේශීය සහ අපනයන වෙළඳපොළ පුළුල් කිරීම සඳහා දැවමය ගුණාංග අතිමහත් වන පයිනස් දැවවල නිෂ්පාදන පරාසයන් විවිධාංගීකරණය කිරීම කරන අතරම අගය වැකතු කල නිෂ්පාදන ආයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් සිටියි. පයිනස් දැව ගෘහ භාණ්ඩ නිෂ්පාදනය, සැහැල්ලු ඉදිකිරීම්, වැටවල්, දොර ජනේල් රාමු, සිවිලිම් හා නාමපුවරු මෙන්ම විදේශීය රටවල සිල්පර නිෂ්පාදනය සඳහා ද යොදා ගනී. තවද සෙල්ලම් බඩු, විසිතුරු නිෂ්පාදන, ඇසුරුම් හා බිත්ති පැනල් වැනි නවීකරණය කරන ලද අයිතමයන් නිෂ්පාදනය කිරීම සඳහා ද පයිනස් ලී භාවිතා කළ හැකිය. එය බොහෝ රටවල ෆින්ගර් ජොයින්ට් නිෂ්පාදනය සඳහා භාවිතා වේ. රාජ්‍ය දැව සංස්ථාවේ බූස්ස සංකීර්ණයේ පිහිටි ෆින්ගර් ජොයින්ට් ඒකකය පයිනස් ලී වලින් ගෘහ භාණ්ඩ සහ ලී පුවරු නිෂ්පාදනය කරයි.

රාජ්‍ය දැව සංස්ථාව විසින් පරිණත පයිනස් වනාන්තර වාර්ෂිකව ඉවත් කර දේශීය හෝ වාණිජ වනවගාවන් සඳහා භූමිය නිදහස් කර දෙනු ලබයි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මේ වනවිට පයිනස් වනාන්තර ඉවත්කර දේශීය ශාක විශේෂ උපයෝගී කරගනිමින් එම වනාන්තර ප්‍රතිනිර්මාණය කිරීමට කටයුතු සංවිධානය කරමින් සිටින අතර, දැනට දෙපාර්තමේන්තුවට අයත් පයිනස් වනාන්තර හෙක්ටයාර 1000ක් පමණ පළල්පත්‍ර වනාන්තර බවට පත් කර ඇත. ගස් හෙලීම 2021 දී ආරම්භ වී 2028 දී අවසන්වීමට නියමිතය. සාමාන්‍යයෙන් පයිනස් වනවගාවලින් හෙක්ටයාරයකට ඝණ මීටර් 300-400 දක්වා දැව ප්‍රමාණයක් නිෂ්පාදනය කෙරෙන අතර එහි වෙළෙඳ වටිනාකම හෙක්ටයාරයකට මිලියන 10ක් පමණ වේ.

එබැවින් ඊළඟ වසරේ නවෝත්පාදන පයිනස් නිෂ්පාදන කෙරෙහි අවධානය යොමු කිරීමෙන් සාමාජික, ආර්ථික, පාරිසරික හා සංරක්ෂණ ප්‍රතිලාභ වැඩිදියුණු වනු ඇත. රාජ්‍ය දැව සංස්ථාවෙහි අනාගත දැක්ම වශයෙන් අපි දැව හෙලීම් ක්‍රියාවලීන්, පදම් කිරීමේ හා පරිරක්ෂණ ක්‍රමවේදයන්, දැව ශ්‍රේණිකිරීම් ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම මෙන්ම වර්තමාන ආර්ථික තත්වයන්ට අනුගතවන පරිදි විද්‍යාත්මක ක්‍රමවේදයන් අනුගමනය කරමින් උසස් තත්ත්වයේ නවෝත්පාදන, නව නිපැයුම් නිෂ්පාදන කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට බලාපොරොත්තු වෙමු.

පිටුම

කොවිඩ්-19 අවදානම් තත්වය මධ්‍යයේ වුවද රාජ්‍ය දැව සංස්ථාවේ සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය, විධායක නිලධාරීන් සහ දැඩි කැපවීමෙන් සේවය ලබාදුන් අනෙකුත් සියලුම සේවකයින් හට මාගේ බලවත් හදපිරි ස්තූතිය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. මෙම බෙදජනක තත්වය තුළ වුවද, දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදනවල ප්‍රමුඛයා වන අප ආයතනයේ සාර්ථක ඉදිරි ගමනට අඩිතාලම දැමූ අපට විශ්වාසවන්තව සිටින වටිනා පාරිභෝගිකයින්ට මාගේ හෘදයාංගම ස්තූතිය පුදු කරන අතර, ඔවුන් සඳහා අපි සැමවිටම අපගේ අද්විතීය නිෂ්පාදන ලබාදීමෙන් අපගේ සේවය උපරිමයෙන් ලබාදීමට සූදානම්ව සිටිමු. අවසාන වශයෙන් ගරු වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා සහ අමාත්‍යාංශ ලේකම්තුමා මෙන්ම වනසංරක්ෂණ ජෙනරාල් සහ වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය 2020 අභියෝගාත්මක කටුක කාලය තුළ අපගේ ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ලබාදුන් නොපසුබට සහයෝගය වෙනුවෙන් මාගේ හෘදයාංගම ස්තූතිය පුදකරමි.



ආචාර්ය. එන්. ඩී. රුවන්පතිරණ
සාමාන්‍යාධිකාරී
රාජ්‍ය දැව සංස්ථාව



අපගේ කාර්යභාරයන්

→ වනාන්තරවලින් දැව කපා ඉවත්කිරීම, එම දැව ඉරූ දැව හා නිමි භාණ්ඩ බවට පරිවර්තනය කිරීම, දැව කඳන්, ඉරූ දැව හා නිමි භාණ්ඩ නිෂ්පාදන අලෙවිය සහ යටෝක්ත කාර්යයන් සඳහා කැලෑ මාර්ග ඉදිකිරීම.

→ දැව කඳන් කිරීමේ මධ්‍යස්ථාන, ඉරුම් මෝල්, තෙල් කැවීමේ හා පරිරක්ෂණ යන්ත්‍රාගාර, දැව වියළීම හා වියළීමේ උඳුන් හා අවශ්‍ය උපකරණ මිළදීගැනීම, ඉදිකිරීම හා ක්‍රියාකරවීම.

→ දැව අලෙවි මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.

→ දැව අතුරු භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය.

→ දැව ආනයනය කිරීම.

→ දැව ආනයනය කිරීම.

→ නව වනවගා ව්‍යාපෘති ආරම්භ කිරීම, නැවත වනවගා කිරීම, කැලෑ සහ වනවගාවන් විද්‍යාත්මකව කළමනාකරණය කිරීම.

→ කෘෂිකාර්මික නිෂ්පාදන.

→ දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි භාණ්ඩ නිෂ්පාදන අපනයනය කිරීම.

→ පෞද්ගලික ඉඩම් වලින් දැව මිලදීගැනීම.

→ වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන පිරි සැකසුම.

→ වේවැල් ආනයනය කිරීම.

→ නියැදි පරීක්ෂා කිරීම් මගින් දේශීය හා ආනයනය කරන ලද දැව හඳුනා ගැනීම සහ දැව සම්බන්ධ සහතික නිකුත් කිරීම.

→ දැව කර්මාන්තය ආශ්‍රිත විෂයයන් පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම, සහතික ප්‍රදානය කිරීම සහ පරිසරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

→ සංස්ථාවට අයත් ඉඩම් හා ගොඩනැගිලිවල සම්පූර්ණ ප්‍රයෝජනය ලබාගැනීම සඳහා සැලසුම් කිරීම සහ ඒ වෙනුවෙන් ආයෝජනය කිරීම.



අපගේ ව්‍යාපාරික වටිනාකම්

→ ඉතාමත් පරිසර හිතකාමී සහ වාණිජ වශයෙන් ජීවමාන රාජ්‍ය අංශයේ ආයතනයක් ලෙස අපගේ ස්ථාවරත්වය පවත්වාගෙන යෑම අපගේ ප්‍රමුඛ වගකීම ලෙස හඳුනා ගනිමු.

→ පිවිතුරු සහ හිතකාමී පරිසරයක් සුරක්ෂිත කිරීම සඳහා වනාන්තර සහ දැව ඉවත් කිරීමේ විද්‍යානුකූල කළමනාකරණයට සම්බන්ධ සියළුම ව්‍යවස්ථාපිත රෙගුලාසීන්ට අනුකූලව එය ඉටු කිරීමට අපි කැපවෙමු.

→ ගනුදෙනුකරුවන් සමඟ ආචාරශීලි ව්‍යාපාරික සබඳතා ගොඩනඟා ගනිමින්, ඔවුනට සහ සියළුම ශ්‍රී ලාංකිකයන්ට වටිනාකම් නිර්මාණය කිරීම අපගේ පැවැත්මේ මූලිකම කාරණය ලෙස අපි පිළිගන්නෙමු.

→ කුසලතා වර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ නිරන්තර අධ්‍යාපනය සහ පුහුණුව තුළින් අපගේ සේවා නියුක්තිකයන්ගේ ඵලදායීතා මට්ටම ඉහළ නැංවීම සඳහා කටයුතු කරන්නෙමු.

→ ගනුදෙනුකරුවන්ට කාර්යක්ෂම සහ ආචාරශීලී සේවයක් සැපයීම සඳහා අපගේ සියළු කාර්යයන්හි දී ඔවුන්ව මූලිකව තබා ගනිමින් කටයුතු කරන්නෙමු.

→ සියළුම මෙහෙයුම් කටයුතු වලදී සහ සේවා සැපයීමේදී පුද්ගලික අවංකභාවය ඉතා ඉහළින්ම තබා ගන්නා බවට සහතික වන්නෙමු.

→ අනාගත පරපුරේ අගනා ජාතික උරුමයන් ලෙස පරිසරය සහ වන සම්පත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් සියළුම ව්‍යවස්ථාපිත රෙගුලාසි සහ සමාජීය ප්‍රතිමාන අනුගමනය කරන්නෙමු.

අධ්‍යක්ෂක මණ්ඩලය - 2020

උදය සී. වලිසිංහ මහතා
සභාපති
රාජ්‍ය දැව සංස්ථාව

බී.එන්.ගමගේ මහත්මිය
අධ්‍යක්ෂ
(භාණ්ඩාගාර නියෝජිත)

ඩබ්ලිව්.ඒ.සී.වේරගොඩ මහතා
අධ්‍යක්ෂ
(වන සංරක්ෂණ ජනරාල්)

පී.කේ.ප්‍රසන්න මහතා
අධ්‍යක්ෂ

පී.ඩී.ප්‍රීති ගුණතිලක මහතා
අධ්‍යක්ෂ

එච්.කේ.එම්.ජේ.එච් කුමාරසිංහ මහතා
අධ්‍යක්ෂ

බී.ඒ.ධර්මරත්න මහතා
අධ්‍යක්ෂ

එම්.ජී. දිලානි ශාරිකා මහත්මිය
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්



ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මඬුල්ල - 2020

ජී.ඩී.එස්. කුමාරසිංහ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය

එම්.ඒ.සී.එන්.සමරසිංහ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත් හා පාලන

එම්.සී.දේවේන්ද්‍ර මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම්

ඩබ්ලිව්.බී.සමන්ත මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි

ජී.ජී. තිසර ගමගේ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වැඩ ආවරණ) - ඉංජිනේරු සහ නිෂ්පාදන

පයිනස් වගාවන් බොහෝවිට ස්ථාපනයකර ඇත්තේ සීඝ්‍ර බෑවුම් සහිත ප්‍රදේශවලය. පාංශු බාදනය අවම කිරීම මෙහි අරමුණවේ. වර්තමානයේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අංශක 30 කට වැඩි ආනතියකින් යුක්ත භූමිවල සහ අඩි 5000කට වැඩි උසකින් යුක්ත ප්‍රදේශවල පාංශු සංරක්ෂණය අරමුණු කරගනිමින් පයිනස් හෙළීම සිදුනොකරයි.

ශ්‍රී ලංකාව තුල වර්තමානයේදී පයිනස් හෙක්ටයාර 16,000 ක් පමණ වගා කර ඇත. ඉන් වැඩි ප්‍රමාණයක එනම් 94% කට වැඩි භූමි ප්‍රමාණයක *Pinus caribaea* var hondurensis ස්ථාපනය කර තිබේ. තවත් හෙක්ටයාර 700 ක පමණ *Pinus patula* විශේෂය ස්ථාපනය කර ඇති අතර ඉහත සඳහන් ප්‍රධාන විශේෂ දෙක සමඟ *Pinus insularis* ද ඉතා සුළු ප්‍රමාණවලින් අඩු තෙතමනයක් සහිත භූමි ප්‍රදේශවල මිශ්‍ර වගාවක් ලෙස ස්ථාපනය කර තිබේ. මෙම පයිනස් වගාවන් රත්නපුර, මහනුවර, බදුල්ල, නුවරඑළිය, මාතලේ, ගාල්ල, කළුතර, කෑගල්ල යන දිස්ත්‍රික්කවල ස්ථාපනය කර ඇත. මෙම පයිනස් වගාවලින් 60% ක අයිතිය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු වන අතර, 38% ක අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතුවේ.

පයිනස් වගා සියල්ල භූමියෙහි අයිතිය පිළිබඳව නොසලකා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නඩත්තුකර ආරක්ෂා කරයි. මෙම පයිනස් වන වගා වැඩ චක්‍ර තුනක් යටතේ කළමනාකරණය කරයි. එනම්, සංවේදී ප්‍රදේශවල ආරක්ෂණ වැඩ චක්‍රයද, සංවේදී නොවන ප්‍රදේශවල දැව නිෂ්පාදන වැඩ චක්‍රය සහ රෙසින් නිෂ්පාදන වැඩ චක්‍රයද ක්‍රියාත්මකවේ.



වාර්ෂික වාර්තාව

රාජ්‍ය දැව සංස්ථාව

- 2020 වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය
- අපගේ ආවරණ කළාප
- විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව - 2020

2020 වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය

රාජ්‍ය දැව සංස්ථාවෙහි 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන හා අපගේ වාර්තාව ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස අප සතුටට පත්වන්නෙමු.

හැඳින්වීම

රාජ්‍ය දැව සංස්ථාව 1968 දී අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද රාජ්‍ය ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදී. රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය “සම්පත්පාය” බත්තරමුල්ල හි පිහිටා ඇති අතර, ප්‍රාදේශීය කාර්යාල දිවයින පුරා පිහිටා ඇත.

ප්‍රධාන ක්‍රියාකාරකම්

රාජ්‍ය දැව සංස්ථාව මූලික වශයෙන් තම ආදායම් උපයාගනු ලබන්නේ දැව හා දැව පදනම් කරගත් නිෂ්පාදන අලෙවියෙනි.

ව්‍යාපාර සමාලෝචනය

පසුගිය වසර හා සැසඳීමේදී, 2020 වර්ෂය ද රාජ්‍ය දැව සංස්ථාව සාර්ථකත්වය ලඟාකරගත් වසරකි. විශ්වසනීයත්වය හා ගුණාත්මකභාවය මත ගොඩනඟන ලද ඉතිහාසයක් සහ විශ්වාසයේ උරුමයන් සහිත කැපීපෙනෙන, කණ්ඩායම් හැඟීමෙන් යුක්ත කීර්තිමත් දැවැන්ත වෙළෙඳ ආයතනයකි. රාජ්‍ය දැව සංස්ථාව 1968 ආරම්භයේ සිටම ගොඩනඟාගත් විශ්වාසයෙන් යුතුව අප රටේ පිළිගත් ගුණාත්මක දැව සැපයුම්කරු ලෙස නොසැලෙන මාවතක ගමන්ගන්නා ව්‍යාපාරයකි.

කොවිඩ්-19 වසංගතය 2020 වර්ෂයේ පළමු කාර්තුවෙහි බොහෝ ව්‍යාපාරික ඒකක කෙරෙහි අහිතකර බලපෑම් ඇති කළ අතර, ඉන්පසු කාලපරිච්ඡේදය තුළ මිශ්‍ර කාර්ය සාධනයක් පෙන්නුම් කරයි. මේ අනුව 2020 මූල්‍ය වර්ෂය රාජ්‍ය දැව සංස්ථාවට ද අතිශයින්ම අභියෝගාත්මක වූ අතර, එහි බලපෑම අඛණ්ඩව මේ වසරේදී ද අත්විඳීමට සිදුව ඇත.

කොවිඩ්-19 වසංගතය පැතිරීම වැළැක්වීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද රට අඟුළු දැමීම ඇතුළු සියලුම ආකාරයේ මර්ධන ක්‍රියාකාරකම් මඟින් ව්‍යාපාර කෙරෙහි ඇති වූ අහිතකර බලපෑම රටේ ආර්ථික ක්‍රියාකාරකම්වලට දැඩිව හානි වූ බැවින්, 2020 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය 3.6%කින් හැකිලී ගියේය. මෙය සාමාන්‍ය පුද්ගලික පරිභෝජනයට මෙන්ම දැව ඇතුළු වෙනත් කර්මාන්ත වෙතද ඍණාත්මක බලපෑමක් ඇති කර ඇත.

අගය උපරිම කිරීම සඳහා පිරිවැය ප්‍රශස්තිකරණය, පරිමාව මත පදනම් වූ වර්ධනය කෙරෙහි ඉහළ අවධානයක් යොමුකිරීම,



ජවසම්පන්න කළමනාකරණය ඇතුළු 2019 වර්ෂයේදී මුහුණ පෑමට සිදුවූ ව්‍යාපාරික ගැටළු සඳහා විසඳුම් සෙවීමේදී අප ලබාගත් අත්දැකීම් සහ දැනුම උපයෝජනය කරගැනීම තුළින් කොවිඩ්-19 තුළින් පැණනැඟුන අභියෝග නොතකා සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ශක්තිමත් කාර්ය සාධනයක් ළඟාකර ගැනීමට රාජ්‍ය දැව සංස්ථාව සමත් විය.

මූල්‍ය කාර්ය සාධනය

කොවිඩ්-19 හි බලපෑම, පාරිභෝගික හැසිරීම මත සහ අපගේ ඇතැම් නිෂ්පාදන කාණ්ඩවල ක්‍රියාකාරිත්වය කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කළේය. රාජ්‍ය දැව සංස්ථාව විසින් 2020 වර්ෂයේ ආදායම ලෙස රුපියල් මිලියන 3,982ක් උපයා ඇති අතර, එය පසුගිය වසරට සාපේක්ෂව 07%ක පසුබෑමකි. එමෙන්ම, සංස්ථාව විසින් 2020 වර්ෂය සඳහා උපයා ඇති දළ ලාභය රුපියල් මිලියන 1,746ක් වන අතර, එය පෙර වසරට සාපේක්ෂව 08%ක අඩුවීමක් පෙන්නුම් කරයි. වසංගත තත්වය තුළින් ඇති වූ ආර්ථික අවපාතය, අඟුළුදැමීමේ නීති, සංචරණ සීමා, සෞඛ්‍ය සහ ආරක්ෂක පියවරයන්හි බලපෑම රාජ්‍ය දැව සංස්ථාවේ මූල්‍ය කාර්ය සාධනය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත.

කාර්ය සාධනය	2020 (රු. මිලි)	2019 (රු. මිලි)
පිරිවැටුම	3,982	4282
දළ ලාභය	1746	1891
මෙහෙයුම් ලාභය	369	277
මෙහෙයුම් නොවන ආදායම්	200	236
භාණ්ඩාගාර බදු සහ ආදායම් බදු පෙර ලාභය	570	513







සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ රාජ්‍ය දැව සංස්ථාව විසින් රුපියල් මිලියන 570ක බදු පෙර ශුද්ධ ලාභය වාර්තා කළ අතර, එය පෙර වර්ෂයට සාපේක්ෂව 11%ක වර්ධනයකි. අගය උපරිම කිරීම සඳහා පිරිවැය ප්‍රශස්ත කළමනාකරණය, පරිමාව කෙරෙහි ඉහළ අවධානය හා සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම මෙම වර්ධනය ළඟාකර ගැනීමට ඉහළ දායකත්වයක් ලබාදී ඇත.

රැකියා අවස්ථා ලබාදීම තුළින් ශ්‍රී ලංකාවේ විරැකියාව තවදුරටත් අඩුකිරීම සඳහා රජයට සහයවීම හා වෙළෙඳපොළට ගුණාත්මක නිෂ්පාදන සැපයීම රජයේ ආයතනයක් වශයෙන් රාජ්‍ය දැව සංස්ථාවෙහි වගකීමක් වශයෙන් අප සලකනු ලබයි. 2020 වර්ෂයේ ආර්ථික අවපාතය යටතේ වුවද, සංස්ථා සේවකයන්ගේ රැකියා සුරක්ෂිතතාව තහවුරු කරමින් සේවක පිරිවැය ලෙස රුපියල් මිලියන 1,640ක් වැයකර ඇත. මුළු සේවක සංඛ්‍යාව 2020 වර්ෂයේ 1,708 හා 2019 වර්ෂයේ 1,803 ක් විය.

2019 හා 2020 වර්ෂ සඳහා වත්කම් මත ප්‍රතිලාභ සහ හිමිකම මත ප්‍රතිලාභ පහත පරිදි වේ.

කාර්ය සාධනය	වත්කම් මත ප්‍රතිලාභ	කොටස් මත ප්‍රතිලාභ
2020	6%	8%
2019	4.4%	5.7%

2019 වර්ෂයේ දී 4.4% ක් වූ බදු ගෙවීමට පෙර සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ 2020 වර්ෂයේ දී 06% දක්වා වර්ධනය වූ අතර, 2019 වර්ෂයේ දී 5.7% වූ සාමාන්‍ය කොටස් මත ප්‍රතිලාභය (ROE) 2020 වර්ෂයේදී ද

8% දක්වා වර්ධනය වී ඇත. කොවිඩ්-19 ලෝක වසංගත තත්වය හමුවේ වුවද සමාලෝචනයට භාජනය වූ වර්ෂයෙහි රජයේ ආදායමට සංස්ථාවේ දායකත්වය රුපියල් මිලියන 1,746ක් වන අතර, භාණ්ඩාගාරයට ගෙවන ලද රු.මිලියන 511ක බදුද වියට ඇතුළත් වේ.

නිෂ්පාදනය

මෙහෙයුම් ක්‍රියාවලිය පරිසර හිතකාමී වීම ගුණාත්මක ඉහළ නිෂ්පාදන මට්ටමක් පවත්වාගැනීම සඳහා මෙන් ම ආයතනයේ පැවැත්මට සහ ලාභදායිතාවයට මෙන් ම ආයතනික අභ්‍යන්තර හා බාහිර සංරචකවල යහපැවැත්මට අත්‍යවශ්‍ය බව සංස්ථාව තරයේ විශ්වාස කරයි.

රජය විසින් පනවනු ලබන නීති හා රෙගුලාසි වලට එකඟතාවය දක්වමින් ඒවාට අනුකූලව කටයුතු කිරීම, ක්‍රමවත් වැඩබිම් වර්ගීකරණ ලැයිස්තුවක් සකස් කිරීම, විද්‍යාත්මක දැව නිස්සාරණය, නිවැරදි දැව පරිරක්ෂණ ක්‍රම භාවිතය, විධිමත් අයුරින් යන්ත්‍රෝපකරණ ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම, සේවකයින් බඳවාගැනීමේ සහ සංවර්ධනය කිරීමේ නිවැරදි ක්‍රමවේදයක් ඇති කිරීම, සංස්ථාවේ කෙටි හා දිගුකාලීන අරමුණු තිරසාර ආකාරයකින් ඉටුකර ගැනීමට ඉවහල් විය. සැබවින් ම රාජ්‍ය දැව සංස්ථාව යනු ශ්‍රී ලංකාවේ තිරසාර වන කළමනාකරණය සඳහා දායකත්වය සපයන ප්‍රධාන ආයතනයයි.

- ඊට අමතරව කර්මාන්තයේ ප්‍රතිවාදීන්ට වඩා තරඟකාරීව වාසි ලබාගැනීම සඳහා පහත සඳහන් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය දැව සංස්ථාව අදහස් කර ඇත.
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවී දෙපාර්තමේන්තුව විසින් නිදහස් කරනු ලබන වනවගා විද්‍යාත්මක දැව නිස්සාරණය කිරීම සඳහා කටයුතු කිරීම.
- වෙළෙඳපොළ සඳහා කඳන්, දුම්රිය දෙපාර්තමේන්තුව වෙත සිල්පර, විදුලිබල මණ්ඩලය සඳහා විදුලිකණු හා වනජීවී දෙපාර්තමේන්තුව සඳහා අලිවැටකණු මෙන්ම පාරිභෝගික ඉල්ලුම සපුරාලීම සඳහා ඉරුදැව නිෂ්පාදනය කිරීම.
- වානිජ වටිනාකම්න් යුතු දැව රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් හා පෞද්ගලික ඉඩම්වලින් මිලදීගැනීම.
- පරිත්‍යාග හා වනඅපරාධ දැව ලබාගැනීම.
- වනවගා වැඩසටහන් සඳහා ක්‍රියාකාරිත්ව සහභාගිවීම. (ක්‍රියාකිරීම හා සහභාගීවීම)
- දුම්රිය සිල්පර ආනයනය කර අගයක් එකතු කිරීමෙන් අනතුරුව ප්‍රති අපනයනය කිරීම.

රජයේ කැළෑවලින් දැව හෙලීම්

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් මුදාහරින ලද පරිණත වනවගාවන් හි ප්‍රමාණය අඩුවීම මෑතකදී අපට මුහුණදීමට සිදු වූ ප්‍රධාන බාධකයකි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව නිදහස් කරන වනවගා ප්‍රමාණය මහා භාණ්ඩාගාරයේ එකඟතාවය මත අමතර ප්‍රමාණයක් නිදහස් කරගැනීමත්, රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් සිල්පර සහ විදුලි සම්ප්‍රේෂණ කණු සඳහා අවශ්‍ය දැව ලබාගැනීමත්, ශ්‍රී ලංකා දුම්රිය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාවට අයත් ඉඩම්වලින් දැව ලබාගැනීමටත් අවශ්‍ය කටයුතු සම්පාදනය වෙමින් පවතී.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වන කළමනාකරණ සැලැස්මකට අනුව හෙලීම් සඳහා තේක්ක, පයිනස් සහ යුකැලිප්ටස් වැනි වන වගා නිදහස් කරනු ලබන අතර 2019 හා 2020 වර්ෂවල හෙලීම් සඳහා නිදහස් කර ඇති හෙක්ටයාර් ප්‍රමාණය පහත පරිදි වේ.

	පූර්ණ හෙලීම් (හෙක්ටයාර්)		තුනීකිරීම් (හෙක්ටයාර්)	
දැව විශේෂය	2020	2019	2020	2019
තේක්ක	692.0	638.0	132.0	128.0
යුකැලිප්ටස්	51.0	119.5	296.0	495.0
පයිනස්	109.4	86.2	0.0	0.0
කායා	0.0	0.0	24.0	49.0
ඇකේෂියා	8.0	69.6	0.0	0.0

ඉරු දැව බවට පරිවර්තනය කිරීම

2020 වර්ෂයේ ඉරුදැව නිෂ්පාදනය ඝන මීටර් 3,387 ට සාපේක්ෂව 2019 වර්ෂය තුළදී ඉරුදැව ඝන මීටර් 4,774 ක් ඉරුම්හල් මගින් නිෂ්පාදනය කර ඇති අතර, ඝන මීටර් 2,279 ක් දිවයින පුරා පිහිටා ඇති දැව අලෙවි ගබඩා මගින් අලෙවි කර ඇත.

විදුලි කණු සහ සිල්පර පරිරක්ෂණය කිරීම

2020 වර්ෂය තුලදී සිල්පර 38,380ක් හා අලිවැටකණු 9,171ක් රාජ්‍ය දැව සංස්ථාවේ කල්දෙමුල්ල, කැප්පෙටිපොල හා බූස්ස පරිරක්ෂණාගාරවලින් පරිරක්ෂණය කර ඇත. පසුගිය වසරට සාපේක්ෂව සිල්පර නිෂ්පාදනය 5%කින් ඉහළ ගොස් ඇති අතර, වනජීවී දෙපාර්තමේන්තුවේ හා විදුලිබල මණ්ඩලයෙහි ඉල්ලුම අඩුවීම මත විදුලිකණු හා අලිවැටකණු නිෂ්පාදනය පසුගිය වසරේ ප්‍රමාණයන් වන 8660ක් හා 11837ක් ඒකකයන්ට සාපේක්ෂව සැළකිය යුතු ප්‍රමාණයකින් පහත වැටී ඇත.

ගෘහභාණ්ඩ නිෂ්පාදනය

රාජ්‍ය දැව සංස්ථාවේ අම්පාර, කල්දෙමුල්ල හා බූස්ස ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාරවලින් රුපියල් මිලියන 233 ක් වටිනා ගෘහභාණ්ඩ සළකා බලන වර්ෂය තුලදී නිෂ්පාදනය කර ඇත. ඒ අතර රුපියල් මිලියන 237 (බදු සහිත) ක් වටිනාකමින් යුත් ගෘහභාණ්ඩ රාජ්‍ය දැව සංස්ථාවේ රත්මලාන, නුවර, රත්නපුර, තලල්ල, බූස්ස, අම්පාර, බණ්ඩාරවෙල හා බත්තරමුල්ල ගෘහභාණ්ඩ ප්‍රදර්ශනාගාර වලින් අලෙවි කර ඇත.

2019 - 2020 වර්ෂවල නිෂ්පාදනය, අලෙවිය හා ආදායම

		නිෂ්පාදන ප්‍රමාණය		අලෙවි ප්‍රමාණය		දළ පිරිවැටුම (රු.මිලියන)	
		2020	2019	2020	2019	2020	2019
කඳුන්	ඝ.මී	106,609	123,206	103955	113,922	3,299	3,445
ඉරුදැව	ඝ.මී	3,387	4,774	2279	3,459	222	307.9
සිල්පර	ඒකක	38,380	36,701	36,552	49,076	371.1	530.5
විදුලි කණු	ඒකක	-	8,660	2,287	6,529	24	63.9
අලිවැට කණු	ඒකක	9,171	11,837	9,347	18,208	48	73.4
වට කණු	ඒකක	67,589	93,783	76,761	97,185	9.3	15.5
දර	ඝ.මී	82,856	107,914	60,171	92,637	39.5	71.9
වැට කණු	ඒකක	105,453	99,047	117,430	125,928	18.7	18.3

ඉලක්ක හා ළඟාකරගැනීම් සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය

රාජ්‍ය දැව සංස්ථාවෙහි කළමනාකාරිත්ව මඩුල්ල විසින් දෛනික මෙහෙයුම් කටයුතු වසර ආරම්භයේ ස්ථාපනය කරන ලද අරමුණුවලට අනුකූල වන බව සහතික කිරීම සඳහා හා අරමුණු සහ ඉලක්ක වසර අවසානයේ දී ළඟාකර ගැනීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගනු ලබයි. ඒ අනුව ප්‍රගතිය අධීක්ෂණය කිරීම ඇතුළු එක් එක් කලාපයට අදාළව පවත්නා හා ඇති විය හැකි සියලු ගැටළු විසඳීම සඳහා සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් සහ සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ සහභාගිත්වයෙන් මාසික ප්‍රාදේශීය කළමනාකරුවන්ගේ රැස්වීමක් රාජ්‍ය දැව සංස්ථාවෙහි කළමනාකාරිත්වය විසින් පවත්වනු ලබයි.

ශ්‍රී ලංකාව මේ වනවිට කොවිඩ්-19 රෝගීන්ගේ වැඩිවීමක් අත්විඳිමින් සිටී. වසංගතයේ ඍණාත්මක බලපෑම් වලින් ඔබ්බට ගොස් අප ජාතිය නැවත ගොඩනැඟීමට සහායවීමට ආයතනයක් වශයෙන් අප විසින් දරන උත්සාහය මත අපගේ ආයතනික අරමුණ පෙර වර්ෂවලට වඩා අදාළ වී තිබේ. අපගේ ප්‍රජාව කෙරෙහි අපගේ වගකීම අප වටහාගෙන ඇති අතර, අපගේ පාර්ශවකරුවන් හට ඉහළ වටිනාකම් ලබාදෙමින් ඔවුන් සමඟ ඉදිරියට යාමට අපි අඛණ්ඩව කටයුතු කරන්නෙමු.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවට.

උදය සී. වලිසිංහ
සභාපති
රාජ්‍ය දැව සංස්ථාව

අපගේ ආවරණ කලාප





විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව 2020

විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්

බියන්කා එන්.ගමගේ මිය - සභාපතිනි
එච්.කේ.ජේ.එච්.කුමාරසිංහ - සාමාජික
ජී.කපිල ප්‍රසන්න - සාමාජික

2020 වර්ෂයේ දී අවධානය යොමු කළ අංශ

- මූල්‍ය වාර්තාකරණය
- අභ්‍යන්තර විගණනය, අවදානම් සහ පාලන
- බාහිර විගණනය
- අනුකූලතාවය

කමිටු අරමුණු

මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණ වගකීම ඉටුකිරීමට සහයවීම මූලික කරගත්, මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි බව, නෛතික හා නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලවීම සහතික කිරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාවලිය, අභ්‍යන්තර පාලන ක්‍රමය සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, අභ්‍යන්තර විගණන කාර්යය හා සියලුම පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීමේ අරමුණින් බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය සහ කාර්යසාධනය සමාලෝචනය කිරීම යන කාර්යයන් ඉටුකිරීම සඳහා විගණන කළමනාකරණ කමිටුව පිහිටුවන ලදී.

ව්‍යාපාරික පරිසරය තුළ මතුවෙමින් පවතින නව ප්‍රවණතා සමඟ ගමන්කිරීම සහ කමිටුවේ වගකීම් නියමිත වේලාවට හා නිසි අයුරින් ඉටුකිරීම සහතික කිරීම දක්වා විගණන කළමනාකරණ කමිටුවෙහි කාර්යභාරය සහ වගකීම් අඛණ්ඩව විකාශනය වේ.

ප්‍රධාන වගකීම්

- මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී අනුගමනය කර ඇති පාලනයන් සමාලෝචනය කිරීම සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව අනාවරණය කිරීම්වල ප්‍රමාණවත් බව සහතික කිරීම.
- සංස්ථාවේ වත්කම්වල සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ අවදානම් කළමනාකරණ

කාර්යයේ ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය අධීක්ෂණය සහ සමාලෝචනය.

- විගණන කමිටුව අනුමත ආවරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම ඇතුළුව අභ්‍යන්තර විගණන කටයුතු අධීක්ෂණය කිරීම.
- බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය සහ කාර්යසාධනය තක්සේරු කිරීම.
- වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනයෙන් පැණනඟින සොයාගැනීම් සළකාබැලීම.
- ඒකාබද්ධ වාර්තාව, විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ අතුරු වාර්තාව අනුමත කිරීම මණ්ඩලයට නිර්දේශ කිරීම.

2020 වර්ෂයේ දී සිදුකරන ලද කාර්යයන්

විගණන කමිටුව 2020 වර්ෂය තුළ පහත සඳහන් ක්‍රියාකාරකම්වල නිරත විය.

01. මූල්‍ය වාර්තාකරණය

අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කිරීමට පෙර කමිටුව අවසාන විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර කළමනාකරණය සමඟ සාකච්ඡා කරන ලදී. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සඳහා භාවිතා කරන තොරතුරු පද්ධතිවල අදාළ පාලනයන්වල ඵලදායීතාවය සහ අවදානම් පිළිබඳව කමිටුව විසින් අබණ්ඩව අවධානය යොමුකරන ලදී. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති විය හැකි මූල්‍යමය බලපෑම සළකාබලා කමිටුව විසින් නිතිපතා ව්‍යාපාරයේ පැවැත්ම පිළිබඳ ඇගයීම් සිදුකරන ලදී. තවද, වර්ෂය තුළදී කමිටුව නිරන්තරයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශ සහ අරමුදල් සම්පාදනය සමාලෝචනය කරන ලදී.

02. අනුකූලතාවය

නියාමන හා නෛතික අනුකූලතාව අධීක්ෂණය කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාපිත බදු අනුකූලතා ප්‍රකාශන ඇතුළු නියාමන හා අනුකූලතා ප්‍රකාශන විගණන කමිටුව සමාලෝචනය කරන ලදී.

03. අභ්‍යන්තර විගණනය, අවදානම් සහ පාලන

සංස්ථාවට බලපාන සියලු ආකාරයේ වැදගත් අවදානම් හඳුනාගැනීම සහ අවම කිරීම සඳහා ඵලදායී උපාය මාර්ග ක්‍රියාත්මක වන බවට කළමනාකාරිත්වයෙන් අවශ්‍ය සහතිකය ලබාගැනීම කෙරෙහි කමිටුව අඛණ්ඩව අවධානය යොමු කර ඇත. වර්ෂය තුළදී අවදානම් හඳුනාගැනීම, ඇගයීම, අවම කිරීම හා පාලන දුර්වලතා සඳහා සංස්ථාව විසින් අනුගමනය කරන ලද ප්‍රධාන අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳව සංස්ථාවෙහි කළමනාකාරිත්වය සමඟ කමිටුව සාකච්ඡා කරන ලදී. සංස්ථාව තුළ අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය පිළිබඳව කමිටුව නිරන්තරයෙන් විමර්ශනය කරන ලදී. පවත්වන ලද අභ්‍යන්තර විගණනයන්හි යාවත්කාලීන කිරීම් ද මෙහි සමන්විත වේ. තවද, මෙම ක්‍රියාවලියට සංස්ථාවේ ස්ථාපිත ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටිවලට අනුකූලවීම සහ නීති හා රෙගුලාසිවලට අනුකූලවීම පිළිබඳ යාවත්කාලීන කිරීමක් ඇතුළත් වේ. සංස්ථාව සඳහා වන අභ්‍යන්තර විගණන සැළැස්ම නියමිත කාල පරතරයන් තුළ කමිටුව විසින් සමාලෝචනය කළ අතර, මෙහෙයුම් පරිසරයට සහ ව්‍යාපාරික අවශ්‍යතාවන්ට සරිලන පරිදි වෙනස්කම් සිදුකරන ලදී.

04. බාහිර විගණනය

කමිටුව බාහිර විගණකවරුන් නිරන්තරයෙන් මුණගැසී ඔවුන්ගේ ස්වාධීනත්වය, විෂය මූලිකත්වය සහ ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය සිදුකළේය. විගණන හා කළමනාකරණ කමිටුව විසින් බාහිර විගණකවරුන් සමඟ රැස්වීම් පවත්වා ඇති අතර, විගණනය සැළසුම් කිරීමේ හා විෂයපථයේ සැළසුම් කරනු ලබන අදියරේදී විගණන සැළැස්ම සමාලෝචනය කිරීම, මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීමට පෙර විගණනය අවසන් කිරීම පිළිබඳ විගණන වාර්තාව සහ අභ්‍යන්තර පාලනයන් වැඩිදියුණු කළ යුතු අංශ සහ විගණකවරුන්ගේ මතය අනුව කළමනාකරණයේ අවධානය යොමු කළ යුතු වෙනත් කරුණු පිළිබඳව මෙහිදී සාකච්ඡා කරන ලදී. තවද, විගණන කළමනාකරණ කමිටුව විසින් බාහිර විගණකවරුන් සමඟ යම් නිශ්චිත කරුණු සාකච්ඡා කිරීම සඳහා ද, සාකච්ඡා පැවැත්විය. විගණන කමිටුව විසින් ඉහළ කළමනාකාරිත්වයේ තොරතුරු ද සැළකිල්ලට ගනිමින් බාහිර විගණකවරුන්ගේ කාර්යසාධනය සමාලෝචනය කළ අතර, සමාලෝචන ප්‍රතිඵල බාහිර විගණකවරුන් හා කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කළේය.

බියන්කා එන්.ගමගේ
සභාපතිනී - විගණන හා කළමනාකරණ කමිටුව.

ව්‍යාපාර සාරාංශය

ආදායම් වර්ධන ප්‍රවණතා විශ්ලේෂණය





ලාභ වර්ධන ප්‍රවණතා විශ්ලේෂණය







නිෂ්පාදන වර්ධන ප්‍රවනතා විශ්ලේෂණ









ප්‍රාග්ධන වියදම් - 2020

විස්තරය (රු.මිලියන 20 වඩා වැඩි)	රු.
ලොතු ලොරි රථය - මාතර ප්‍රාදේශිකය	19,800,000
බිබිලේ කැබ් රථ 03 - ප්‍රධාන කාර්යාලය	27,750,000
සතතාර ප්‍රාදේශිය කළමනාකාර කාර්යාලය ඉදිකිරීම - යාපනය ප්‍රාදේශිකය	7,924,533
වැරිලි ඇබ්බේම - ප්‍රධාන කාර්යාලය	4,375,980
අටවි මඩු - කොළඹ ප්‍රාදේශිකය	3,411,081
කොස්ගොඩ ලොරිය ඉදිකිරීම - රත්නපුර ප්‍රාදේශිකය	2,649,199
කොස්ගොඩ ලොරිය ඉදිකිරීම - කැස්බෙවිලපොළ	2,727,456
කොස්ගොඩ ලොරිය ඉදිකිරීම - අනුරාධපුර ප්‍රාදේශිකය	2,548,904

ආයෝජන

	2020.12.31	2019.12.31
රජයේ ආයතනවල කාමිකාමික අරමුදල් ආයෝජන	-	486,568,114
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	219,691,174	203,624,016
ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව	500,000	500,000
මහජන බැංකුව	785,754,782	526,885,770
ලංකා බැංකුව	1,486,003,969	861,011,950

දශකයක තොරතුරු

		2011	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020
වර්ෂය සඳහා මුළු ආදායම	රු. '000	3,103,744	3,563,390	3,213,644	3,756,482	4,132,052	4,522,238	4,630,718	4,457,024	4,608,413	4,372,033
වර්ෂය සඳහා දළ ලාභය	රු. '000	1,237,640	1,546,107	1,197,518	1,453,450	1,757,115	2,045,090	2,075,950	1,964,647	1,890,812	1,745,766
පොලී සහ බදු වලට පෙර ශුද්ධ ලාභය	රු. '000	603,499	801,681	382,337	427,222	768,699	659,732	966,804	672,433	512,947	569,521
මුළු සේවක පිරිවැය	රු. '000	953,498	1,065,052	1,117,036	1,254,516	1,449,749	1,789,572	1,572,775	1,553,598	1,584,418	1,640,020
වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම්	රු. '000	180,546	162,509	332,870	115,132	244,929	113,675	94,637	116,034	319,485	104,712
වර්ෂය අවසානයේ පවතින ජංගම නොවන වත්කම්	රු. '000	1,739,893	1,479,880	1,658,535	1,654,908	1,743,580	1,732,640	1,894,597	1,978,855	2,581,165	1,966,637
වර්ෂය අවසානයේ පවතින ජංගම වත්කම්	රු. '000	2,177,892	2,929,185	3,153,777	4,004,860	4,115,259	3,652,116	4,423,105	4,541,610	4,640,889	5,319,557
වර්ෂය අවසානයේ පවතින ජංගම වගකීම්	රු. '000	497,229	804,102	1,050,258	1,591,991	1,480,966	897,087	1,234,716	1,047,668	967,481	985,365
වර්ෂය අවසානයේ පවතින ජංගම නොවන වගකීම්	රු. '000	399,953	409,030	384,831	484,649	424,854	499,373	852,292	812,441	714,022	836,197
වර්ෂය අවසානයේ පවතින ස්කන්ධය	රු. '000	3,020,602	3,195,933	3,377,223	3,583,129	3,953,019	3,988,297	4,230,694	4,660,357	5,540,551	5,464,633
ඒකාබද්ධ අරමුදලට දායක වීම	රු. '000	75,000	600,000	50,000	25,000	50,000	175,000	100,000	100,000	50,000	511,026
වර්ෂය අවසානයේදී සේවකයින් සංඛ්‍යාව	සංඛ්‍යාව	2,267	2,187	2,139	2,186	2,145	2,125	2,083	2,001	1,803	1,708
වර්ෂය අවසානයේදී අතිරික්ත අරමුදල ආයෝජනය කිරීම	රු. '000	764,328	298,546	338,010	360,227	382,550	405,727	431,404	457,962	486,568	-

ප්‍රධාන කාර්ය සාධන දර්ශක											
කොටස් වලට බදුවලට පෙර ශුද්ධ ලාභය	%	19.98	25.08	11.32	11.92	19.45	16.54	22.85	14.43	9.26	10.42
මූල්‍ය වෙනස්වීම් වලට පෙර ශුද්ධ ලාභය සහ මුළු වත්කම් සඳහා බදු	%	15.40	18.18	7.94	7.55	13.12	12.25	15.30	10.31	7.10	7.82
ජංගම අනුපාතය	වාර ගණන	4.38	3.64	3.00	2.52	2.78	4.07	3.58	4.33	4.80	5.40
ස්කන්ධය : වත්කම් අනුපාතය	වාර ගණන	0.77	0.72	0.70	0.63	0.67	0.74	0.67	0.71	0.77	0.75
වත්කම් මත ප්‍රතිලාභ	%	7.68	3.73	3.78	3.64	6.31	0.66	3.84	6.59	12.19	8.00
මුළු ආදායම් වර්ධනය	%	(14.17)	14.81	(9.81)	16.89	10.00	9.44	2.40	(3.75)	3.40	(5.13)

පයිනස් දැව වල ගතිගුණ

කේතුධර ශාකයක් ලෙස ශ්‍රී ලාංකීය පරිසර තත්ත්ව යටතේ වැඩෙන පයිනස් ශාකවල දැව ඝණත්වය 400 - 650 kgm^{-3} අතර පරාසයක පවතී. පයිනස් දැවවල වැඩ කිරීමේ හැකියාව හොඳ මට්ටමක පවතින අතර පයිනස් දැව පරිරක්ෂණය කිරීම තුළින් දැව දිරාපත් කරන ජීවීන්ගේ හානි වලින් තොරව දිගු කාලයක් තබාගත හැකිය. පරිරක්ෂණය කිරීමේ හැකියාවද ඉතා ඉහළ මට්ටමක පවතී.

මධ්‍යස්ථ දැවයක් ලෙස සැලකිය හැකි පයිනස් දැවවල සාමාන්‍ය භංජන මාපාංකය (Modulus of Rupture) 60 Nmm^{-2} ක්ද, සාමාන්‍ය ප්‍රත්‍යස්ථ මාපාංකය (Modulus of Elasticity) 8,000Nmm^{-2} ක්ද පමණ වේ. සම්පීඩන ප්‍රබලතාවය සැලකූ විට (වෛරමට සමාන්තරව), Compression Parellal to Grain 40 Nmm^{-2} ක්ද පමණ වේ. පීඩනය යටතේ මැලියම් මඟින් ඇලවීම ඉතා පහසුය.



වාර්ෂික වාර්තාව
රාජ්‍ය දැව සංස්ථාව

- අවදානම් කළමනාකරණය
- ආයතනික සමාජ වගකීම

අවදානම් කළමනාකරණය

තිරසාර වර්ධනයක් මෙන්ම ආයතනික අරමුණු හා පරමාර්ථ ළඟා කරගැනීමෙහි ස්ථාවර ප්‍රගතියක් ලබාගැනීම සඳහා ව්‍යාපාර සහ මූල්‍ය අවදානම් කළමනාකරණය මූලික වශයෙන් වැදගත් වේ. “අවදානම” මුළුමණින් ම “තුරන් කිරීමට” නොහැකි සාධකයක් වන අතර, මෙහෙයුම් අබණ්ඩව සමාලෝචනය හා උපාය මාර්ග අනුගමනය කරමින් අවදානම් “අවම කිරීම” සංස්ථාව සහතික කරයි. මෙම ඉලක්කය සපුරාගැනීම සඳහා විවිධ උපාය මාර්ග සකස් කර ක්‍රියාත්මක කරනු ලැබේ.

අවදානම් පරිසරය

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2020 මූල්‍ය වර්ෂය ඉතා අභියෝගාත්මක වසරක් විය. කෙසේ වෙතත්, ක්‍රියාශීලී නායකත්වය සහ දැව සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම තුළින් මෙම අවිනිශ්චිතතාවයන් මඟහරවා අපගේ මූලික ව්‍යාපාරය සමඟ ශක්තිමත් ලෙස වර්ධනය විය හැකි බව අපගේ විශ්වාසයයි. තවද, විවිධාංගීකරණය වූ කර්මාන්තයක සිටීම අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ දී සංස්ථාවට ශක්තියක් වූ අතර, ආර්ථික අවපාත පසුබිම තුළ වුවද ස්ථාවර ප්‍රකෘතියක් ලබාගත්තෙමු.

අවදානම් පාලනය

අවදානම් කළමනාකරණය අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන වගකීමක් වන අතර, අවදානම් කළමනාකරණය පිළිබඳ අධීක්ෂණ වගකීම ඇති විගණන කමිටුව විසින් මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය සහය ලබාදේ. අවදානම් හඳුනාගැනීම, මැනීම, කළමනාකරණය අවම කිරීම සහ අවදානම් අධීක්ෂණය මෙන්ම අභ්‍යන්තර විගණනයට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට අවදානම් වාර්තා කිරීමට සෑම අංශ ප්‍රධානියෙකුම වගකීමෙන් බැඳී සිටී.

අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

රාජ්‍ය දැව සංස්ථාවෙහි අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සියලුම ආකාරයේ ව්‍යාපාරික හා මූල්‍ය අවදානම් මැනවින් හඳුනාගැනීම, විශ්ලේෂණය කිරීම සහ ප්‍රතිචාර දැක්වීම සහතික වන පරිදි සකස් කර ඇත. මෙය ව්‍යුහාත්මක අවදානම් පාලන ක්‍රමවේදයකට පහසුකම් සපයන අතර, ව්‍යාපාරයේ සෑම අංශයකම අවදානම් ඇතිවීමට පෙර හඳුනාගත හැකි සංස්කෘතියක් (Risk aware culture) ඇති කරමින් ප්‍රමාණවත් අවදානම් ඇගයීම, හඳුනාගැනීම සහ අවමකිරීම සහතික කරනු ඇත.

1. අවදානම් හඳුනාගැනීම

අවදානම් හඳුනාගැනීමේ පරමාර්ථය වන්නේ ආයතනයක අරමුණු සාක්ෂාත් කරගැනීමට උපකාරී වන හෝ වළක්වා වන/බාධා ඇති කරවන අවදානම් සොයාගැනීම, හඳුනාගැනීම සහ විස්තර කිරීමයි.



අවදානම් හඳුනාගැනීමේ දී ව්‍යාපාරයට අදාළ, සුදුසු සහ යාවත්කාලීන තොරතුරු වැදගත් වන අතර, අරමුණු එකකට හෝ වැඩි ගණනකට බලපාන අවිනිශ්චිතතාවයන් හඳුනාගැනීම සඳහා ආයතනයකට විවිධ වූ ක්‍රමවේදයන් භාවිතා කළ හැකිය.

2. අවදානම් විශ්ලේෂණය

අවදානම් විශ්ලේෂණයේ මූලික පරමාර්ථය වනුයේ අවදානමේ ස්වභාවය හා සුදුසු අවස්ථාවන්හිදී අවදානමෙහි බලපෑමේ ප්‍රමාණය ඇතුළු ලක්ෂණ අවබෝධ කර ගැනීම වන අතර, අවදානම් විශ්ලේෂණයට, අවිනිශ්චිතතාවයන්, අවදානම් ප්‍රභවයන්, ප්‍රතිවිපාක, සම්භාවිතාව, සිදුවීම්, අවස්ථා, පාලනයන් සහ ඒවායේ කාර්යක්ෂමතාව පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් ඇතුළත් වේ. තොරතුරුවල විවිධ බව, සංකීර්ණතාව, විශ්ලේෂණයේ අරමුණ මත පදනම්ව, තොරතුරු ලබාගැනීමේ හැකියාව සහ විශ්වසනීයත්වය හා පවතින සම්පත් මත විශ්ලේෂණය සිදුකළ හැකිය. අවස්ථාව හෝ වාතාවරණය මත හා අපේක්ෂාව මත විශ්ලේෂණ ශිල්පීය ක්‍රම ගුණාත්මක, ප්‍රමාණාත්මක හෝ මෙහි සංයෝජනයක් විය හැකිය.

3. අවදානම් ඇගැයීම

තීරණ ගැනීමේ ක්‍රියාවලියට අවශ්‍ය සහයෝගය ලබාදීම, අවදානම් ඇගැයීමේ මූලික අරමුණ ලෙස හැඳින්විය හැක. අවදානම් විශ්ලේෂණයේ ප්‍රතිඵල ස්ථාපිත අවදානම් නිර්ණායක සමඟ සංසන්දනය කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල මත අවදානම් කළමනාකරණය සඳහා අමතර ක්‍රියාමාර්ගවල අවශ්‍යතාව හඳුනාගැනීම අවදානම් ඇගයීමේ ක්‍රියාවලියට ඇතුළත් වේ. එම තීරණ පහත පරිදි විය හැක.

- කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීම.
- අවදානම් සඳහා ප්‍රතිකාර ක්‍රම සළකාබැලීම.
- අවදානමෙහි බලපෑම තවදුරටත් අවබෝධ කරගැනීම සඳහා වැඩිදුර විශ්ලේෂණය.
- පවත්නා පාලනයන් පවත්වාගෙන යාම.
- අරමුණු නැවත සළකාබැලීම.

4. අවදානම් ප්‍රතිකාර

අවදානම් ප්‍රතිකාර ක්‍රියාවලියෙහි පරමාර්ථය වන්නේ අවදානම විසඳීම සඳහා විකල්ප විසඳුම් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම වේ. එහි පහත පරිදි පුනරාවර්තන ක්‍රියාවලියක් ඇතුළත් වේ.

- අවදානම් ප්‍රතිකාර සඳහා විකල්ප විසඳුම් සකස් කිරීම සහ තෝරාගැනීම.
- තෝරාගත් විකල්පය සැළසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ක්‍රියාත්මක කරන ලද ප්‍රතිකාරයේ ඵලදායීතාවය තක්සේරු කිරීම.
- ඉතිරිව පවතින අවදානමෙහි බලපෑම ආයතනයකට පිළිගත හැකි ද යන්න තීරණය කිරීම.
- පිළිගත නොහැකි නම්, තවදුරටත් ප්‍රතිකාර ක්‍රම ක්‍රියාත්මක කිරීම.

අවදානම් තාප සිතියම (Risk Heat Map)



අවදානම් නිරාවරණය	අරමුණු	අවදානම් අවමකිරීමේ උපායමාර්ග
මූල්‍ය අවදානම් කළමනාකරණය		
1. ද්‍රවශීලතාවය සහ මුදල් කළමනාකරණය.	වෙළෙඳපොළ අවස්ථාවන්ට වේගවත් ප්‍රතිචාර දැක්වීම සහතික කිරීම සඳහා ක්ෂණික අරමුදල් සැපයීමේ හැකියාව තහවුරු කිරීම.	දිගු කාලීන ණය මඟින් දිගුකාලීන වත්කම් සඳහා අරමුදල් සැපයීම.
	සෑම විටම "ප්‍රමාණවත්" ද්‍රවශීලතා මට්ටමක් පවත්වා ගැනීම.	සෑම විටම සංස්ථාවට කෙටි කාලීන ණය ගැනීමේ පහසුකම් ලබාගැනීම.
		වියදම් පාලනය සඳහා මුදල් බලතල වටිනාකම මත බෙදා ඇත.
		අනාගත අරමුදල් අවශ්‍යතා සඳහා ඇපකරයක් ලෙස ඉදිරිපත් කළ හැකි පොත් වටිනාකම්වලට වඩා සැළකිය යුතු ලෙස වෙළෙඳපොළ වටිනාකම් සහිත ඉඩම් සහ ගොඩනැඟිලි සංස්ථාව සතුව ඇත.
		විවිධ මූල්‍ය ආයතන හරහා අරමුදල් අවශ්‍යතා සපුරාගැනීම.
2. පොළී අනුපාත අවදානම	පොළී අනුපාත අස්ථාවරත්වයේ අහිතකර බලපෑම් අවම කිරීම.	සංස්ථාවේ ආයෝජන සඳහා හැකි උපරිම පොළී අනුපාතය ලබාගැනීම සඳහා බැංකු සමඟ සාකච්ඡා කිරීම.
	ණයගැනීමේ පිරිවැය අවම මට්ටමක පවතින බව සහතික කිරීම.	ඉහළ පිරිවැය අවම කිරීම සහ දේශීය පොළී අනුපාතවල අහිතකර උච්චාවචනයන් වළක්වා ගැනීම සඳහා සැපයුම්කරුවන්ගේ ණය ලබාගැනීම හා සාකච්ඡා කිරීම.
	කොටස් මත ප්‍රතිලාභ ප්‍රශස්ත කිරීම.	අඩු gearing අනුපාතයක් පවත්වා ගැනීම සහ ඵලදායී කාරක ප්‍රග්ධන කළමනාකරණය.
ව්‍යාපාර අවදානම් කළමනාකරණය		
3. කොවිඩ්-19 අවදානම	නිලධාරීන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව සහතික කිරීම.	සෞඛ්‍ය බලධාරීන් විසින් ලබාදී ඇති මාර්ගෝපදේශ දැඩි ලෙස අනුගමනය කිරීම.
	අඛණ්ඩව ව්‍යාපාර මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සහතික කිරීම.	වෛරස් බලපෑම පිළිබඳව කම්කරුවන් හට අවශ්‍ය දැනුම ලබාදීම.
		අහඹු සාම්පල මත PCR පරීක්ෂණ සිදුකිරීම.
		අමුද්‍රව්‍ය සහ අවසන් භාණ්ඩ සඳහා ස්වාරක්ෂක තොග පවත්වාගැනීම.

4. ණය අවදානම	ණය ගැතියන් ණය පැහැර හැරීම් ආශ්‍රිත අවදානම් අවම කිරීම.	ණය ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
		සියලුම ප්‍රධාන ගනුදෙනුකරුවන් සඳහා බැංකු ඇපකර, තැන්පතු සහ ඇපකරය ලබාගැනීම.
		ණය ලබාදීමට පෙර ගනුදෙනුකරුවන්ගේ ණය ලබාදීමේ සුදුසුකම් සහතික කිරීම සඳහා දැඩි තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටි අනුගමනය කිරීම.
		ණයගැතියාගේ ශේෂයන්සමීපව අධීක්ෂණය කිරීම, ක්‍රියාකාරී සැළසුම් සකස් කිරීම සහ එම ක්‍රියාකාරී සැළසුම් අපේක්ෂිත අන්දමින් ක්‍රියාත්මක වන බව තහවුරු කිරීම.
5. වත්කම් අවදානම	ගින්නෙන්, සොරකමින් සහ යන්ත්‍රෝපකරණ බිඳවැටීමේ අවදානම අවම කිරීම.	සියලුම ස්පෘශ්‍ය වත්කම් සඳහා පුළුල් රක්ෂණ ආවරණ ලබා ගැනීම.
		අනිවාර්ය වැළැක්වීමේ නඩත්තු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
		ගිනි නිවීම වැනි ක්ෂේත්‍රවල නිරත සේවකයන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
6. අභ්‍යන්තර පාලනයන් හා බැඳි අවදානම	සංස්ථා වත්කම් ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් පවත්වා ගැනීම.	පද්ධති විගණනය, තොග සහ මුදල් ගණනය කිරීම් ඇතුළු සියලුම විගණන අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන පාලන යාන්ත්‍රණයන් සිදුකිරීම.
		සංස්ථාවේ කාර්යසාධනය එහි ඉලක්කවලට අනුකූල බව සහතික කිරීම සඳහා අයවැය ක්‍රියාවලියක් සහ අයවැය පාලන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම.
7. කීර්ති නාමය හා බැඳි අවදානම	කීර්ති නාමයට හානි පමුණුවන හේතූන් ඇතිවීම වැළැක්වීම.	නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා අඛණ්ඩ පුහුණුව, තත්ත්ව කළමනාකරණය සහ සහතික කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
	අපගේ ක්‍රියාපටිපාටියෙන් බැහැරව කීර්ති නාමය පිළිබඳ අර්බුදයක් ඇති වුවහොත් එහි බලපෑම අවම කිරීම.	නිරතුරුව අභ්‍යන්තර හා බාහිර තත්ත්ව පරීක්ෂා සිදුකිරීම.
		නිෂ්පාදන පහසුකම් සඳහා අඛණ්ඩ ආයෝජන හා වැඩිදියුණු කිරීමේ පියවරයන් ගැනීම.
		බාහිර තත්ත්ව පාලන ආයතන මඟින් සහතික ලබා ගැනීම.
		ප්‍රතිගත නිෂ්පාදන ක්‍රියාවලියක් ස්ථාපනය.

8. මානව ප්‍රාග්ධනය හා කම්කරු අවදානම	බාධාවකින් තොරව අබණ්ඩ මෙහෙයුම් ක්‍රියාවලිය සහතික කිරීම.	දිරි දීමනා සහ සුභසාධක කටයුතු මඟින් සේවක ප්‍රතිලාභ පුළුල් කිරීම.
	මානව සේවායෝජකයෙකු ලෙස අපව ආකර්ෂණය කිරීම, අභිප්‍රේරණ කටයුතු සාර්ථකව ඉටුකිරීම, සංවර්ධනය කිරීම, රඳවාගැනීම සහ ගුණාත්මක සේවක ප්‍රාග්ධනයක් ආකර්ෂණය කරගැනීම.	සේවක බඳවාගැනීම්, කාර්යසාධන ඇගැයීම් සහ අභ්‍යන්තර මෙන්ම බාහිර පුහුණු වැඩසටහන් සම්බන්ධයෙන් මානව සම්පත් අංශයේ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම.
		කාර්ය සාධනය මත පදනම් වූ සංස්කෘතියක් සංස්ථාව තුළ ප්‍රවර්ධනය කිරීම.
9. තාක්ෂණික අවදානම	වර්තමාන තාක්ෂණික වර්ධනයන්ට අනුගතවීම සහ යල්පැණයාම වැළැක්වීම.	නව තාක්ෂණයන් සහ ස්වයංක්‍රීයකරණය සඳහා අබණ්ඩ ආයෝජනය.
		වර්ෂය පුරා පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා ආයෝජනය කිරීම.
10. වෙළෙඳපොළ තරඟකාරිත්ව අවදානම	අපගේ වෙළෙඳපොළ කොටස උපරිම කිරීම.	ඉහළ ගුණාත්මක බවින් යුතු නිෂ්පාදන වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම.
	මූලික නිෂ්පාදනවලින් ජනනයවන ආදායම ඉහළ නැංවීම.	මිලගණන්වල තරඟකාරී බව සහතික කිරීම සඳහා නිෂ්පාදන ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව වැඩිකිරීම.
		අවශ්‍යතා හඳුනාගැනීම සඳහා වෙළෙඳපොළ පර්යේෂණ සිදුකිරීම.
		වෙළෙඳ ප්‍රචාරණ සහ ඉලක්ක අලෙවිකරණය තුළින් සංස්ථා සන්නාමය තවදුරටත් ශක්තිමත් කිරීම.
		ප්‍රදර්ශනාගාරවල පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණ වැඩසටහන් ස්ථාපනය.
11. පාරිසරික, දේශපාලනික සහ නියාමන අවදානම	අපගේ පාලනයෙන් බැහැරව ඇති බාහිර පරිසරයේ ඇති වන විචලනයන්ගෙන් ඇති විය හැකි සෘණාත්මක බලපෑම අවම කිරීම.	අදාල බලධාරීන් විසින් නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූලවීම සහ අනුකූලතාවය සහතික කිරීම.
	නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලවීම.	ව්‍යවස්ථාපිත හා නියාමන ආයතනවල අවශ්‍යතාවයන්ට අනුකූලවීම.



පයිනස් දැව පරිරක්ෂණය හා පදම් කිරීම

පයිනස් දැව බ්ලූ-ස්ටේන් (Blue-stain) දිලීර රෝගයට ගොදුරු වන බැවින් කපා හෙලූ විගස මෙන්ම ඉරූ දැව බවට පරිවර්තනය කල විගසද පරිරක්ෂණය කිරීම සිදුකල යුතුය. එම නිසා කපා හෙලූ විගස පොත්ත නිරාවරණය වූ සියලූ ස්ථාන වෙත දිලීර නාශක ස්ප්‍රේ කිරීම සිදුකල යුතුය. එහිදී පරිරක්ෂකය ජලද්‍රාව්‍ය බැවින් තද වර්ෂාවකින් පසු ආලේප සේදී යන අතර එසේ තද වර්ෂාවකට ලක් වුවහොත් නැවත ආලේප කල යුතුය. පරිරක්ෂක ද්‍රාවණය සකසා ගැනීමේදී දිලීර නාශක ලීටර් 1.5 ක් පමණ ජලය ලීටර 100 ක දියවන පරිදි මිශ්‍රණය සකසා ගත යුතුය (අවශ්‍ය ද්‍රාවණ ප්‍රමාණය සකසා ගැනීමට මෙම අනුපාතය අනුව ගණනය කර සකසා ගත යුතුය).

ඉරූ දැව පරිරක්ෂණය සඳහා යොදා ගන්නේ බෝරෝන් ප්‍රතිකාරකය වන අතර එය ජල ද්‍රාවය වේ. එබැවින් පයිනස් දැව දීර්ඝ කාලීන පූර්ව පදම් කිරීමකින් තොරව පරිරක්ෂණය සඳහා යොදාගත හැකිය. රික්ත ප්‍රතිකාරක ක්‍රමය වඩාත් කාර්යක්ෂම නමුත් වියදම ඉහළය. ඒ සඳහා විශේෂිත රික්ත පීඩන ක්‍රමයට බෝරෝන් පරිරක්ෂණය කරන ඒකක අවශ්‍ය වන අතර ඒ සඳහා පුහුණු සේවකයන්ද අවශ්‍ය වේ. ගිල්වීමේ ක්‍රමයෙන් ද පරිරක්ෂණය කල හැකිය.

ආයතනික සමාජ වගකීම

වගකීමෙන් යුතු රාජ්‍ය ආයතනයක් ලෙස, සියලුම බාහිර හා අභ්‍යන්තර පාර්ශවයන්ගේ වර්තමාන හා අනාගත පැවැත්ම අපගේ පැවැත්මට ද අත්‍යවශ්‍ය සාධකයක් බව අපගේ විශ්වාසයයි. ඒ අනුව දැව ව්‍යාපාරය තවදුරටත් වගකීමෙන් හා තිරසාර බවින් වැඩිදියුණු කරමින් ආර්ථිකමය වශයෙන් දියුණුවක් ළඟා කරගැනීම සඳහා නව ක්‍රමෝපායන් ස්ථාපිත කිරීම අපගේ අරමුණ වේ.



පරිසරය කෙරෙහි අපගේ කැපවීම

වනවගාවන්හි නියැලී සිටින රාජ්‍ය ආයතනයක් ලෙස පාරිසරික තිරසාර සංවර්ධනය සඳහා අප කැපවී සිටින අතර, සංස්ථාව මගින් සිදුකරනු ලබන සියලු ක්‍රියාකාරකම් පරිසරයට හිතකාමී අයුරින් සිදුවන බවට සහතික කිරීමට හැකිසෑමවිටම උත්සාහ දරන්නෙමු. අපගේ මෙහෙයුම් හා සංවර්ධනයන්ට සමගාමීව පරිසරය ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ දියුණු කිරීම සඳහා අප උපරිම උත්සාහයන් දරන්නෙමු.

එම අරමුණු ඉටුකරමින් රාජ්‍ය දැව සංස්ථාව 2020 මූල්‍ය වර්ෂය තුළ පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- රාජ්‍ය දැව සංස්ථාව පවත්වාගෙන යනු ලබන පැල තවාන් මගින් නොමිලේ පැල බෙදාදීම.



රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රාදේශික 14 මගින් පැල තවාන් 26ක් නඩත්තු කෙරෙන අතර, ඒවායේ දැවමය වටිනාකම්න් යුත් පැල නිෂ්පාදනය කෙරේ මෙම පැල විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වෙත නොමිලේ නිකුත් කිරීම පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය මගින් සිදුකෙරේ.





2020 වර්ෂය සඳහා රාජ්‍ය දැව සංස්ථාවේ තවාන්වල පැල 120,000 පමණ නිෂ්පාදනය සිදුකර ඇති අතර, පැල 78,207ක් රුක් රෝපණ වැඩසටහන් සඳහා නොමිලේ බෙදා දී ඇත.

තවද, "ආරාමාරෝපා වනරෝපා" වැඩසටහන යටතේ යාපනය, අනුරාධපුර හා පොළොන්නරුව යන ප්‍රාදේශිකවල පැල 450ක් පමණ රෝපණය කරන ලදී.

සේවකයින් කෙරෙහි අපගේ කැපවීම

පුහුණුව හා සංවර්ධනයේ වටිනාකම හඳුනාගෙන සංස්ථාව විසින් තම සේවකයින් සඳහා විවිධ පුහුණු හා සංවර්ධන වැඩසටහන් පවත්වනු ලැබේ. සංස්ථාව හරහා ලබාදී ඇති පුහුණුවීම් ඉහළ කාර්ය සාධනයක් සඳහා ඉවහල් වී ඇති අතර, ඔවුන්ගේ සේවා ජීවිත සමතුලිතතාවය කළමනාකරණය කිරීමට ද උපකාරී වී තිබේ.

රාජ්‍ය දැව සංස්ථාවේ කල්දෙමුල්ල දැව තාක්ෂණ පුහුණු ආයතනය මගින් පුහුණුව සහ තම ක්ෂේත්‍රයේ දැනුම වැඩිදියුණු කරවීමට අවශ්‍ය සේවකයන් විවිධ පුහුණු සඳහා යොමුකිරීම සිදුකරන අතර, වැඩිදුරටත් අවශ්‍ය දැනුම ලබාදීමට බාහිර ආයතනවල පුහුණු වැඩසටහන් සඳහා ද යොමු කරනු ලැබේ.

ඒ අනුව 2020 වර්ෂය සඳහා කල්දෙමුල්ල දැව තාක්ෂණ පුහුණු ආයතනය මගින් සහ අනෙකුත් බාහිර ආයතන මගින් සිදුකරනු ලැබූ පුහුණු වැඩසටහන් සඳහා සේවකයන් යොමුකිරීම පහත පරිදි වේ.

වැඩසටහන පැවැත් වූ ආයතනය	පාඨමාලාව/වැඩමුළුව	පාඨමාලා /වැඩමුළු සංඛ්‍යාව	යොමුකරන ලද සේවක සංඛ්‍යාව
කල්දෙමුල්ල දැව තාක්ෂණ පුහුණු ආයතනය හා අනුබද්ධව	ගබඩා නිලධාරී අලෙවිකරණ පුහුණු වැඩමුළුව	02	120
	පරිගණක පුහුණු පාඨමාලාව	03	43
	ආනයනික ඉරෑ දැව පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු පාඨමාලාව	01	19
	ගෘහභාණ්ඩ ක්ෂේත්‍රය නගා සිටුවීම පිළිබඳ පුහුණු පාඨමාලාව	03	22
	දැව ශ්‍රේණි කිරීම පිළිබඳ පුහුණු පාඨමාලාව	02	75
	NVQ සහතික පත්‍ර විභාග පාඨමාලාව	01	17
	දැව ඔපදැමීමේ එක්දින පුහුණුව	01	22
ප්‍රාදේශිකවල ක්‍රියාත්මක කරන ලද ඵලදායිතා වැඩසටහන්	බූස්ස	01	72
	පොළොන්නරුව	01	30
	මොණරාගල	01	40
	අනුරාධපුර	01	30

බාහිර ආයතන මගින් (SDFL, SLSI, NIBM, CETRAC, ප්‍රාග් ක්‍රම සම්පාදන, විශ්වවිද්‍යාල)	මානව සම්පත් කළමනාකරණය		
	අලෙවිකරණය පුහුණු කිරීමේ පාඨමාලාව		
	මූල්‍ය කටයුතු පිළිබඳ පුහුණු පාඨමාලාව		
	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු පාඨමාලාව		
	බොයිලේරු ක්‍රියාකාරකම් පිළිබඳ පුහුණු පාඨමාලාව	44	164
	විනය ක්‍රියාමාර්ග පිළිබඳ පුහුණු පාඨමාලාව		
	සේවක අභිප්‍රේරණය පිළිබඳ පුහුණු පාඨමාලාව		
	වනවිද්‍යා පශ්චාත් උපාධි පිළිබඳ පුහුණු පාඨමාලාව		
	කාර්යාල උපකරණ නඩත්තුව පිළිබඳ පුහුණු පාඨමාලාව		
	අභ්‍යන්තර විගණනය පිළිබඳ පුහුණු පාඨමාලාව		
පුහුණු සඳහා යොමුකරන ලද මුළු සේවක සංඛ්‍යාව			**654**

2020 වර්ෂයේ මෙහෙයවන ලද පුහුණු පාඨමාලා ගණන 61 යි.
මුළු සේවක සංඛ්‍යාව 654 යි.
මුළු මුදල රු.2,359,705/-







තවද, කර්මාන්තශාලා තුළ සහ වැඩබිම් ඇතුළු සේවා ස්ථානයේ සෞඛ්‍ය හා ආරක්ෂක පියවරයන් පිළිබඳව සේවක දැනුවත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් නිරන්තරයෙන් පවත්වනු ලබන අතර, සෞඛ්‍ය හා ආරක්ෂිත මාර්ගෝපදේශ අනුගමනය කිරීමට සහ ප්‍රමිතීන් පවත්වා ගැනීමට සේවකයින් දිරිමත් කරනු ලැබේ. විචක්ෂණශීලි සේවා යෝජකයෙකු වන අප, සේවක වෛද්‍ය බිල්පත් ගෙවීමට හා හදිසි අනතුරු මගින් ඇතිවන පාඩු පියවා ගැනීමට අවශ්‍ය රක්ෂණ ආවරණ ලබාදී ඇත්තෙමු.

කොවිඩ්-19 වෛරසය ද්විතීයික සම්ප්‍රේෂණය සහ පැතිරීම වැළැක්වීම පිළිබඳව සේවකයන් දැනුවත් කිරීම් මගින් සේවකයින් ආරක්ෂා කිරීමට සංස්ථාව කැපවී සිටී. තවද, වෛරසය පිළිබඳ තොරතුරු, අවදානම අඩු කරගන්නේ කෙසේද, වෛරසයේ රෝග ලක්ෂණ, සාමාන්‍ය ප්‍රතිකාර සහ වෙනත් වැදගත් තොරතුරු සේවකයන් අතර ප්‍රචාරණය කරන ලදී. මෙම කොවිඩ්-19 පාලන උපක්‍රමයන් සමඟ මුහුණු ආවරණය සහ සනීපාරක්ෂක දියර සියලුම සේවකයන්ට බෙදා දෙන ලදී.



ප්‍රජා සංවර්ධනය සඳහා අපගේ කැපවීම

ප්‍රජාව සංස්ථාවේ ප්‍රධාන පාර්ශවකරුවෙකු වන අතර, දැව කර්මාන්තයේ සාර්ථකත්වය සහ පැවැත්ම එහි දායකත්වය අත්‍යවශ්‍ය වේ. කල්පවත්නා නිෂ්පාදන කාණ්ඩයට අයත් දැව නිෂ්පාදන නිෂ්පාදකයෙකු ලෙස, සමස්තයක් ලෙස සමාජයට ප්‍රතිලාභ ලබාදෙමින් ගනුදෙනුකරුවන් තෘප්තිමත් කිරීම සඳහා සාධාරණ මිලකට උසස් තත්ත්වයේ නිෂ්පාදන සැපයීම අපගේ වගකීම වේ. ඒ අනුව 2020 වර්ෂයේ ප්‍රජා සංවර්ධන වැඩසටහනක් ලෙස පරිසර අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් ගාල්ලේ සහ කලේගාන හි පාර්සරික විශය සම්බන්ධව විද්‍යා ගුරුවරුන් 150 දෙනෙකු පුහුණු කරන ලදී. මීට අමතරව කොවිඩ්-19 වැළැක්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට රජයට සහායවීමක් වශයෙන් සංස්ථාව මගින් සියලුම සේවකයන්ගේ එක් දිනක වැටුප කොවිඩ්-19 අරමුදලට පරිත්‍යාග කරන ලද්දේය.

Timber related research studies in 2020

පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය මගින් දැව ආශ්‍රිත පර්යේෂණ සිදු කර වීවා පර්යේෂණ පත්‍රිකා, සම්මන්ත්‍රණ හෝ ආදි ලෙස පල කරනු ලැබේ. එසේ 2020 වසරට අදාළ පර්යේෂණවල විස්තර පහත පරිදි වේ.

N.D. Ruwanpathirana, W.V.T.D. Amarasinghe, C.I.M. Archchi. 2020. Estimation of carbon retention potential in timber logs of State Timber Corporation, Sri Lanka Neela Haritha, vol.03, climate change secretariat, Ministry of Environment, Sri Lanka. pp 147-152.

Muthumala, C.K. 2020. Investigation of the strength parameters and physical properties of dry zone timber species, The Sri Lanka Forester, Forest department, Sri Lanka. Vol.40, pp, 27-36

Muthumala, C. K., Sudhira, De Siva, Arunakumara, K.K.I.U. and Alwis, P.L.A.G. 2020. Identification of Joint Efficiencies in 13 mm Finger jointed timber species in Sri Lanka, ICSBE2018 - LNCE 44 Springer nature.pte, ltd. Singapore. pp. 261-267.

Muthumala, C. K., DeSiva, Sudhira, Arunakumara, K.K.I.U. and Alwis, P.L.A.G., 2020. Investigation of the relationship between densities vs. mechanical properties of Sri Lankan timber species, ,ICSECM 2019 - LNCE Vol. 94, Springer nature.

Muthumala C.K, G S Y De Silva, Arunakumara K.K.I.U and Alwis P.L.A.G. 2020. Investigation of the best joint type for combining of the finger jointed timber panel in board production.. International Conference on Sustainable Build Environment, Kandy, Sri Lanka.

C.K. Muthumala, Sudhira De Silva, K.K.I.U. Arunakumara and P.L.A.G. Alwis., 2020. Finger-joint technique to mitigate climate change, NeelaHaritha Vol.3, 2020, Climate Change Secretariat, Ministry of Environment, Sri Lanka. pp. 147-152.

Balasooriya B.M.L.S., Amarasinghe, W.V.T.D., Weerakkody, W.J.S.K. and Muthumala C.K. (2020).

Development of Bucking Techniques to improve timber grading of Teak (Tectona grandis). Proceedings of 19 th Agricultural Research Symposium, Faculty of Agriculture and Plantation Management, Wayamba University of Sri Lanka, ISBN 978-955-8746.

Jinadari W.M., Weerakkody, W.J.S.K., Amarasinghe, W.V.T.D. and Muthumala C.K. (2020). Estimation of Above Ground Carbon Stock of Teak (Tectona grandis) Stands in Intermediate Zone of Sri Lanka. Proceedings of 19 th Agricultural Research Symposium, Faculty of Agriculture and Plantation Management, Wayamba University of Sri Lanka, ISBN 978-955- 8746 .

Muthumala CK, WVTD Amarasinghe, TS Mudalige. 2020. Assessment of Wood Properties in Lesser-Known Shorea Spp. in Sri Lanka. 11th International Conference on Sustainable Built Environment (ICSBE), Kandy, Sri Lanka. p. 82.

- මෙම පර්යේෂණවල සොයා ගැනීම් දැව හා වන විද්‍යාව හදාරන ශිෂ්‍යන්ට හා පර්යේෂකයන්ට ඉතා වැදගත් වන අතර මෙම සොයා ගැනීම් රාජ්‍ය දැව සංස්ථාවේ කේෂ්ත්‍ර ක්‍රියාකාරකම් සඳහා ද යොදා ගනී.





පයිනස් දැව වලින් නිර්මිත ගෘහභාණ්ඩ හෝ සීලිම් හෝ වෝල් පැනල් හෝ ගොඩනැගිලි අභ්‍යන්තරයේ තෙතමනය නොගැටෙන ස්ථාන සඳහා යොදන අවස්ථාවලද ඉතා ඉහළ දැව පරිරක්ෂක කා වැදීමක් අත්‍යවශ්‍ය නොවේ (සිල්පර නිෂ්පාදනය කරන්නේ නම් රික්ත ප්‍රතිකාරක ක්‍රමයෙන් ක්‍රියෝසෝට් හෝ ACQ පරිරක්ෂක භාවිතා කර පරිරක්ෂණය කල යුතුය).

ගෘහ භාණ්ඩ හා අනෙකුත් ඉරෑ දැව වලින් කෙරෙන අයිතම නිෂ්පාදනයේදී යතු සඳහා ගාන බැවින් දළ වශයෙන් 3 mm ප්‍රමාණයක් (නූලක්) පමණ ඉවත් වේ. එබැවින් 3 mm ට ඉහළ පරිරක්ෂක කාවැදීමක් අවශ්‍ය වේ. රික්ත ප්‍රතිකාරක ක්‍රමයෙන් පරිරක්ෂණය කිරීමේදී 19 x 150 mm" 25 x 150 mm" 31 x 150 mm මෙන්ම 50 x 125 mm වැනි හරස්කඩ දක්වා වන ඉරෑ දැව සම්පූර්ණ කා වැදීමකට ලක්වේ.

Dipping ක්‍රමයෙන් දැව පරිරක්ෂණයේදී 19 x 150 mm හරස්කඩ පරිරක්ෂණයට පැය 06 පමණ ගිල්වා තැබීම ප්‍රමාණවත් නමුත් අනෙකුත් හරස්කඩ සඳහා 3 mm ට ඉහළ කාවැදීමකට ලක්කිරීමට අවම වශයෙන් පැය 24 ක් පමණ ගිල්වා තැබීම සිදුකල යුතුය.

පයිනස් දැව වල ප්‍රයෝජන

- පල්ප සහ කඩදාසි නිෂ්පාදනය සඳහා මෙම ශාක කඳේ දිග තන්තු යොදාගනී.
- සිවිලින් පැනල් නිෂ්පාදනය සඳහා යොදාගනී.
- දුරකථන සහ විදුලි රැහැන් සඳහා යොදාගන්නා සම්ප්‍රේෂණ කණු සඳහා යොදාගනී.
- දුම්රිය මාර්ගවල සිල්පර ලෙස විදේශීය රටවල යොදාගනී.
- ඔලියෝ රෙසීන නිශ්පාදනය සඳහා යොදාගනී.
- ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සඳහා විදේශීය රටවල සැළකියයුතු ප්‍රමාණයක් යොදාගනී.
- තුනි ලැලි නිෂ්පාදනයටද පයිනස් දැව යොදාගනී.





වාර්ෂික වාර්තාව

රාජ්‍ය දැව සංස්ථාව

- විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } අයි ඊ එන් /සී/එස් ටී සී/ඒ/2020/01

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2021 ජූලි 29 දින

30 JUL 2021
රාජ්‍ය දැව සංස්ථාව

සභාපති,
රාජ්‍ය දැව සංස්ථාව

රාජ්‍ය දැව සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් :
ලේකම් - වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය
ලේකම් - මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
+94 11 2 88 70 28 - 34
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
+94 11 2 88 72 23
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } අයිඊඑන් /සී/එස්ටීසී/ඒ/2020/01

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2021 ජූලි 29 දින

සභාපති,
රාජ්‍ය දැව සංස්ථාව

රාජ්‍ය දැව සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

රාජ්‍ය දැව සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
+94 11 2 88 70 28 - 34
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
+94 11 2 88 72 23
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 32 වන වගන්තියට අනුව වත්කම් හා වගකීම් හිලවකිරීමක් කළ නොහැකි වුවත්, ඊට පටහැනිව, සමාලෝචිත වර්ෂයේ පූර්ණ හෙලීම් කරන ලද සියළු වන වගාවලට අදාලව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ස්කන්ධ භාගය රු.1,143,231,084 කින් පැරණි තේක්ක මුල් සහ අලුත් තේක්ක මුල් නෙර ගැසීම් වෙනුවෙන් සංස්ථාවට ලැබිය යුතු රු. 53,384,642 ක් හිලවිකර ශුද්ධ අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ට අනුව අවසන් තොගය, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට අගය කළ යුතු අතර, අවසන් තොගයේ පිරිවැයට වඩා ශුද්ධ උපලබ්ධි අගය අඩුවන විට, එම වෙනස වියදමක් ලෙස ලාභයෙන් කපා හළ යුතු වුවත්, ඉහත ප්‍රමිතියට පටහැනි ලෙස සංස්ථාව විසින් වෙළඳ තොග සඳහා, තොග නශ්‍ය වීම වෙනුවෙන් සියයට 15 ක ප්‍රතිශතයක එනම් රු.244,674,912 ක් වෙන් කිරීමක් අවසන් තොගයෙන් අඩු කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. එමෙන්ම තොග අධිවෙන් කිරීම් ලෙස රු.44,165,123 ක් සහ තොග ඌන වෙන් කිරීම් ලෙස රු.54,329,480 ක් ලාභයට ගලපා තිබීමෙන් ශුද්ධ අගය රු.10,164,357 කින් ලාභය අඩුවෙන් ගිණුම් ගතවී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 හි 28 ඡේදයෙහි සඳහන් පරිදි අසම්භාව්‍ය වගකීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කළ යුතු වුවත්, රු. 5,328,908 ක වන්දි ඉල්ලා සංස්ථාවට එරෙහිව පවරා තිබූ නඩු 05 ක් සම්බන්ධයෙන්, මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව්කර නොතිබුණි. තවද, රු.294,000 ක අසම්භාව්‍ය වත්කම්වලට අදාලව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 37 හි 34 ඡේදයෙහි සඳහන් ආකාරයට, මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කිරීමක් කර නොතිබුණි.

(ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල කල්බදු වාරික ගෙවීම රු.8,564,544 ක් වූ මුදල් ගලායාම් රු.12,150,297 ක මුදල් ගලාඒමක් ලෙස දැක්වීම, රඳවාගත් ඉපයීම්වලින් සේවක ණය වක්‍රීය අරමුදලට මාරු කරන ලද රු.13,570,520 ක් මුදල් ගලායාමක් හෝ මුදල් ගලාඒමක් සිදු නොවූවද මුදල් ගලා ඒමක් ලෙස දැක්වීම, පාරිතෝෂික ගෙවීම් රු.71,813,395 ක් මුදල් ගලායාමක් ලෙස දැක්වීම වෙනුවට ආරම්භක හා අවසාන ශේෂ අතර වෙනස වූ රු.42,882,621 ක් මුදල් ගලාඒමක් ලෙස දැක්වීම, සේවක ණය ගෙවීම්

රු.151,863,773 ක් මුදල් ගලා යාමක් ලෙස සහ සේවක ණය අයකර ගැනීම් රු. 122,712,917 ක් මුදල් ගලා ඒමක් ලෙස දක්වා නොතිබීම සහ වෙනත් පොලී ආදායම් වූ රු.17,855,947 ක් මුදල් ගලා ඒමක් ලෙස ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවත් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දැක්වීම් සිදුකර තිබුණි.

(ඉ) බදු අයකළ යුතු ආදායම ගණනය කිරීමේ දී ඉඩ නොදෙන වියදම් වල ඇතුළත් වර්ෂයේ පාරිතෝෂික වියදම රු.17,291,991 ක් අඩුවෙන් හා ඉඩදෙන වියදම් පාරිතෝෂික ගෙවීම් රු.12,892,329 ක් අඩුවෙන් ගලපා තිබුණි. මෙසේ ආදායම් බදු ගණනයේ දී පාරිතෝෂික ගැලපීම් වෙනස්වීම් නිසා, වර්ෂයේ ආදායම් බද්ද රු.1,055,918 කින් ඌන තක්සේරුවක් වී ඇති බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඊ) කඳුරුවෙල දැව ගබඩාවේ පවතින වන අපරාධ දැව සම්බන්ධයෙන් අවසන් වූ නඩු 14 කට අදාල රු.2,064,022 ක් වූ තොග 2020 දෙසැම්බර් 31 දින අවසන් තොගයට ගෙන නොතිබුණි. ඒ අනුව 2020 වර්ෂයේ තොගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගණනය කර තිබුණි.

(උ) පොළොන්නරුව ප්‍රාදේශීය කාර්යාලයෙහි තොග පොත් තුලනය කර නොතිබුණු බැවින්ද, ඇතැම් දැව විශාල ලෙස දිරාපත් වී තිබූ හෙයින් ද, බොහෝ දැව කඳන් අංක සමඟ හඳුනා ගත නොහැකි බැවින්ද, භෞතික තොග සත්‍යාපනය නිවැරදිව සිදු කළ නොහැකි බව විගණනයේදී නිරීක්ෂණය විය. ඒ අනුව භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල සඳහන් රු.133,120,313ක් වූ අවසන් තොග වටිනාකම නිවැරදි නොවන අතර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් රු.1,855,504,860 ක් වූ දැව තොග වටිනාකමෙහි නිවැරදිභාවය තහවුරු කළ නොහැක.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම් උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මම ලබාදීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත්, මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත්, නිවැරදි නොකල වරදවා දැක්වීම් තිබෙනම් ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ, නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය වි්කරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගනනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2(ආ) ඡේදයේ සඳහන් නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට යොමුව	විස්තරය
2020 ඔක්තෝම්බර් 26 දිනැති අංක 02/2020 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ වක්‍රලේඛය අනුව	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල් විසින් සංස්ථාවේ අනුමත කරන ලද සේවක සංඛ්‍යාවේ ඇතුලත් නොවන තනතුරක් වන අධ්‍යක්ෂක මණ්ඩල ලේකම් තනතුර සඳහා බාහිර පුද්ගලයෙකු අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත පැවරුම් පදනමට බඳවාගෙන 2020 වසර සඳහා රු.337,000 ක් මුදලක් "උපදේශන සේවා සහ විශේෂ ගෙවීම්" යටතේ ගෙවීම් කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

සංස්ථාවේ අරමුණු අතරින් කෘෂිකාර්මික නිෂ්පාදන, වේවැල් අපනයනය යන අරමුණු ඉටුකර ගැනීමට සංස්ථාව කටයුතු කර නොමැති අතර අපේක්ෂිත පරිදි දැව අතුරු භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවියද සිදු කර නොතිබුණි. එමෙන්ම දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි භාණ්ඩ අපනයනය කිරීම සංස්ථාවේ අරමුණක් වුවද එම අරමුණු ඉටු කර ගැනීම සඳහා සංස්ථාව කටයුතු කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ණය ශේෂය රු.1,009,459,934 ක් වූ අතර ඉන් රු.6,797,675 ක් වර්ෂයකට වඩා වැඩි කාලයක්ද, රු.1,490,500 ක් වර්ෂ 5 කට වඩා වැඩි කාලයක්ද ඉක්මවා ගොස් තිබුණ ද අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ශේෂය රු.45,007,462 ක් වූ අතර ඉන් රු.38,451,121 ක් වර්ෂයකට වඩා වැඩි කාලයක් ඉක්මවා ගොස් තිබුණි.

(ආ) කදුරුවේල ගබඩාවේ 2014 සිට 2018 දක්වා වූ කාලයට අදාල අපරාධවලට අදාල දැව රු.421,102 කට තක්සේරු කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් වූ නඩු කටයුතු පරීක්ෂාකර අවශ්‍ය ක්‍රියාමාර්ග 2021 අප්‍රේල් වනවිටත් ගෙන නොතිබුණි.

(ඇ) මින්නේරිය ප්‍රාදේශීය කාර්යාලයේ නිල නිවාස 30 ක් පවතින අතර ඉන් නිවාස 07 ක් පමණක් භාවිතයට ගෙන තිබුණි. නිවාස 10 ක් ජෛව විවිධත්ව උද්‍යානයේ කාර්යයන් සඳහා භාවිතයට ගන්නා අතර ඉතිරි නිවාස 13 ක් නිෂ්ක්‍රීයව පැවතුණි. ඉන් නිල නිවාස දෙකක් හැර ඉතිරි නිවාස 11 ක් භාවිතයට ගත නොහැකි තත්වයේ පැවතිණි.

(ඇ) මින්නේරිය ගබඩාවට අදාළව පැවති නඩු 170 න් නඩු 32 ක් 2011 සහ 2012 වර්ෂයන්ට අදාළ දැව අපරාධ නඩු වන අතර එම දැව්වල වටිනාකම රු.1,667,882 ක් විය. පැරණි දැව විශාල ලෙස හානිවෙමින් පවතින අතර මෙම දැව භෞතිකව පවතින්නේද යන්න තහවුරු කරගත නොහැකි විය.

(ඉ) 2015 වර්ෂයේදී මින්නේරිය ප්‍රාදේශීය කාර්යාලයට අයත් හල්මිල්ලෑව 03/006 තේක්ක වැඩබිමෙහි සිදුවී ඇති ගස් 69 ක් අස්ථානගත කිරීමේ අනුක්‍රමිකතාව සම්බන්ධයෙන් පැවති ස්වාධීන විනය පරීක්ෂණ මණ්ඩලය විසින් සිදුවී ඇති පාඩුව ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට 2018 නොවැම්බර් 17 දින නිර්දේශ කර තිබුණි. මෙම නිර්දේශයට පටහැනිව සංස්ථාවේ හිටපු සභාපතිවරයා විසින් එම නියෝගය ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම හේතුවෙන් සංස්ථාවට රු.2,994,536 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ඊ) නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයට අයත් වූ රොබිගිල් වැඩබිමෙහි කොටස් 4 යටතේ ගස් 2172 ක් හෙළීමේ කොන්ත්‍රාත්තුව පිරිනැමීමට ටෙන්ඩර් ඇගයීමකින් තොරාගත් කොන්ත්‍රාත්කරුවන් ඉල්ලා අස්වීම නිසා ඔවුන් එකඟ වී තිබූ මිලටම කොන්ත්‍රාත්තුව පිරිනැමීමට සංස්ථාව කටයුතු නොකිරීමෙන් රු. 2, 725, 541ක මුදලක් ද, ටෙන්ඩර් කොන්දේසි 36 ප්‍රකාරව වැඩ බිමට සිදුවන හානි වෙනුවෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සංස්ථාව ගෙවන ලද එහෙත් කොන්ත්‍රාත්කරුගෙන් අයකර නොගත් රු.253,250 ක මුදල ද, සහ ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව නියමිත දිනට වැඩ නිම නොකිරීම හේතුවෙන් සංස්ථාවට අයවිය යුතු එහෙත් අයකර නොගත් දඩ හා ප්‍රමාද ගාස්තුව රු.960,000 ක මුදලක් වශයෙන් එකතුව රු.3,938,791ක පාඩුවක් සංස්ථාවට සිදුවී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

එසේම මෘදු දැවයක් ලෙස පයිනස් බොහෝ රටවල ෆින්ගර් ජොයින්ට් නිෂ්පාදනය සඳහා යොදාගනු ලැබේ. රාජ්‍ය දැව සංස්ථාවේ බූස්ස සංකීර්ණයේ ස්ථාපනය කර තිබෙන ෆින්ගර් ජොයින්ට් ඒකකය මඟින් පයිනස් දැව ගෘහභාණ්ඩ හා දැව පුවරු (Boards) නිෂ්පාදනය කෙරේ.

ගෘහ භාණ්ඩ, සැහැල්ලු ඉදිකිරීම් කටයුතු, වැට කණු, දොර ජනෙල් පලු, සිවිලින් ලෑලි මෙන්ම, විදේශීය රටවල සිල්පර නිෂ්පාදනයටද පයිනස් දැව යොදාගනී. ඝණත්වය අඩු දැව සෙල්ලම් බඩු නිෂ්පාදනයට මෙන්ම, විවිධ ඇසුරුම් නිෂ්පාදනයට හා බිත්ති පැනල් සඳහා යොදාගත හැකිය.

පදම් කළ පයිනස් දැව ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සඳහාද යොදාගත හැකිය. සෘජු කඳක් සහිත බැවින් දුරකථන සහ විදුලි රැහැන් සඳහා යොදා ගන්නා සම්ප්‍රේෂණ කණු වලට වඩාත් යෝග්‍යය. ඉහත සඳහන් ප්‍රයෝජන අතුරින් වර්තමානයේදී ඔලියො රෙසීන නිෂ්පාදනය කෙරෙහි වැඩි අවධානයක් යොමුවේ. වර්තමානයේදීද වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු පයිනස් වන වගාවලින් සැළකියයුතු ප්‍රමාණයක් ඔලියො රෙසීන නිස්සාරණය සඳහා පුද්ගලික ආයතන කිහිපයකට වාර්ෂිකව බදුදෙනු ලැබේ. පයිනස් වන වගා හෙක්ටයාරයකට දැව ඝන මීටර 300-400ක් පමණ නිෂ්පාදනය කරන අතර එහි වෙළඳපොළ වටිනාකම හෙක්ටයාරයකට රු.මිලියන 10 ක් පමණ වේ.



වාර්ෂික වාර්තාව

රාජ්‍ය දැව සංස්ථාව

- වාර්ෂික ගිණුම්
- ගිණුම් සඳහා සටහන්

ආදායම් ප්‍රකාශය
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන්	2020 රු.	2019 රු.
පිරිවැටුම	2	3,981,688,028	4,282,180,939
විකුණුම් පිරිවැය	3	(2,235,922,452)	(2,391,369,247)
මෙහෙයුම් මත දළ ලාභය		**1,745,765,576**	**1,890,811,692**
වෙනත් ආදායම්	6		
මෙහෙයුම්	6.3	187,156,251	87,824,390
මෙහෙයුම් නොවන	6.1	11,254,590	11,057,320
මුළු ශුද්ධ ආදායම		**1,944,176,417**	**1,989,693,402**
විකුණුම් හා බෙදාහැරීමේ වියදම්	4	(695,762,455)	(742,594,548)
පරිපාලන වියදම්	5	(868,197,159)	(958,780,970)
මූල්‍ය වියදම		(2,629,259)	(2,721,433)
මූල්‍ය ආදායම	6.2	191,933,650	227,350,832
භාණ්ඩාගාර බදුවලට පෙර ශුද්ධ ලාභය		**569,521,194**	**512,947,283**
වර්ෂය සඳහා ආදායම් බදු	7	(105,614,520)	(195,523,628)
ආදායම් බදුවලට පසු ලාභය		**463,906,674**	**317,423,655**

විස්තීරණ ආදායම් ප්‍රකාශණය
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන්	2020 රු.	2019 රු.
ආදායම් බදු පසු ලාභය		**463,906,674**	**317,423,655**
භාණ්ඩාගාරයට ගෙවූ බදු		(511,025,803)	(50,000,000)
වෙනත් විස්තීරණ ආදායම්			
විශ්‍රාමික පාරිතෝෂික අතිරික්ත/ඌණතා	18	(28,798,768)	159,663,864
ප්‍රත්‍යාගණන සංචිතය			453,106,621
වෙනත් විස්තීරණ ආදායම්		**(28,798,768)**	**612,770,485**
මුළු විස්තීරණ ආදායම්		**(75,917,897)**	**880,194,140**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
දෙසැම්බර් 31 දිනට

	සටහන්	2020 රු.	2019 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	8	1,560,609,739	1,654,290,912
භාවිත හිමිකම් වත්කම් (ROU)	10	4,810,252	9,250,483
අස්පෘශ්‍ය වත්කම්	9	501,278	904,151
ජීව විද්‍යාත්මක වත්කම්	11	7,735,659	7,469,659
භාණ්ඩාගාර තැන්පත්		2,966,000	2,966,000
සේවක ඇප තැන්පත්		71,738,627	70,063,718
